මුදල් කොමිෂන් සභාව

நிதி ஆணைக்குழு

**Finance Commission**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ජ (4) ව්‍යවස්ථාව ප්‍රකාරව

2024 වර්ෂය සඳහා

# ගරු ජනාධිපතිතුමා වෙත ඉදිරිපත් කරනු ලබන නිර්දේශ

இலங்கை ஜனநாயக சோசலிசக் குடியரசின் அரசியலமைப்பின் உறுப்புரை 154R (4) பிரகாரம்

# கௌரவ ஜனாதிபதிக்கு 2024 ஆம் ஆண்டிற்காக சமர்ப்பிக்கப்பட்ட பரிந்துரைகள்

# RECOMMENDATIONS SUBMITTED TO THE HON. PRESIDENT

In terms of Article 154R (4) of the Constitution of the

Democratic Socialist Republic of Sri Lanka

for the year 2024

**2023 ඔක්තෝබර්**

**ஒக்ரோபர** 2023

**October 2023**

# මුදල් කොමිෂන් සභාව

(ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 "ජ" ව්‍යවස්ථාව යටතේ පිහිටුවන ලදී.)

# நிதி ஆணைக்குழு

(அரசியலமைப்பின் 154 "ண" ஆம் உறுப்புரையின் கீழ் தாபிக்கப்பட்டது)

# FINANCE COMMISSION

(Established under Article 154 "R" of the Constitution)

03, සරණ මාවත, රාජගිරිය, ශ්‍රී ලංකාව.
இல. 03, சரண மாவத்தை, ராஜகிரிய, இலங்கை.
03, Sarana Mawatha, Rajagiriya, Sri Lanka.


මගේ අංකය / எனது இல. / My No. FC/PSR/08/01/2023

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 2023.10.31

ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමා,
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති,
ජනාධිපති කාර්යාලය,
කොළඹ 01.

ගරු ජනාධිපතිතුමනි,

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ජ ව්‍යවස්ථාවේ (4)(අ) අනු ව්‍යවස්ථාව අනුව මුදල් කොමිෂන් සභාව විසින් 2024 වර්ෂය වෙනුවෙන් ඉදිරිපත් කළ යුතු නිර්දේශ මේ සමඟ ඉදිරිපත් කරමි. පළාත් සභා සඳහා එළඹෙන වර්ෂය වෙනුවෙන් අවශ්‍ය වන සම්පත් පිළිබඳ නිර්දේශයන් ද ජාතික අයවැයෙන් පළාත් සභා වෙත ලබාදෙනු ලබන අරමුදල්, රට තුළ තුලිත ප්‍රාදේශීය සංවර්ධනයක් අත්කර ගැනීම අරමුණු කරගෙන පළාත් සභා අතර බෙදාදීමේ දී අනුගමනය කළ යුතු මූලධර්ම පිළිබඳ නිර්දේශයන් මෙන්ම පළාත් සභා සඳහා වඩාත් අර්ථාන්විත පරිදි සම්පත් වෙන් කර දීම හා එකී සම්පත් වඩාත් කාර්යක්ෂම ලෙස යොදාගැනීම පිළිබඳව වන ප්‍රතිපත්ති නිර්දේශ කිහිපයක් ද මෙම වාර්තාවේ ඇතුළත් වේ.

මෙයට විශ්වාසී,

සුමිත් අබේසිංහ

සභාපති

මුදල් කොමිෂන් සභාව


සභාපති / தலைவர் / Chairman (+94)011 2866724
ලේකම් / செயலாளர் / Secretary (+94)011 2866824
කාර්යාලය / அலுவலகம் / Office (+94)011 2866747
ෆැක්ස් / தொலைநகல் / Fax (+94)011 2866671 (+94)011 2866679
විද්‍යුත් තැපැල / மின்னஞ்சல் / E-mail info@fincom.gov.lk

www.fincom.gov.lk

# මුදල් කොමිෂන් සභාව

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ජ (4)
ව්‍යවස්ථාව ප්‍රකාරව

2024 වර්ෂය සඳහා

## ගරු ජනාධිපතිතුමා වෙත ඉදිරිපත් කරනු ලබන නිර්දේශ

**2023 ඔක්තෝබර්**

# පටුන

**පිටු අංකය**

**අන්තර්ගතය**


| | |
|---|---|
| 01. හැඳින්වීම | 01 - 02 |
| 02. ශ්‍රී ලංකාවේ මූල්‍ය පාලන බලතල විවිධ මට්ටම්වලට පවරා දීම | 03 - 06 |
| 03. 2024 වර්ෂය සඳහා පළාත් ප්‍රාග්ධන සහ පුනරාවර්තන අවශ්‍යතා තක්සේරු කිරීම | 07 - 16 |
| 04. 2024 වර්ෂය සඳහා රජයේ ප්‍රදාන පළාත් සභා අතර වෙන් කරදීම  පිළිබඳ නිර්දේශය | 17 - 21 |
| 05. ප්‍රතිපත්තිමය නිර්දේශ | 22 - 27 |


**ඇමුණුම**


| | | |
|---|---|---|
| **ඇමුණුම 01**: | යෝජිත ආදායම් ගැලපීමෙන් පසුව නිර්දේශිත පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදානය සංයුක්ත දර්ශකයට අනුව පළාත් අතර බෙදී යන ආකාරය පැහැදිලි කිරීම | 28 |

# 1 වන පරිච්ඡේදය

## හැඳින්වීම

### 1.1 පසුබිම

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ජ (3) අනුව්‍යවස්ථාව ප්‍රකාරව පළාත් සභාවල අරමුදල් අවශ්‍යතාවය හා රජය විසින් පළාත් සභා වෙත වෙන්කර දෙනු ලබන අරමුදල් පළාත් නවය අතර බෙදා හැරීම හා සම්බන්ධ මූලධර්ම ඇතුළත් මුදල් කොමිෂන් සභාවේ 2024 වර්ෂයට අදාලව නිර්දේශ වාර්තාව මේ සමඟ ගරු ජනාධිපතිතුමා වෙත ඉදිරිපත් කෙරේ. ඒ සමඟම දිවයිනේ තුළනාත්මක ප්‍රාදේශීය සංවර්ධනයක් ඇති කිරීම අරමුණු කරගනිමින් වඩාත් අර්ථාන්විත පරිදි සම්පත් වෙන්කර දීමත් එකී සම්පත් කාර්යක්ෂම හා ඵලදායී ලෙස උපයෝජනය කිරීමත් සඳහා මුදල් කොමිෂන් සභාව විසින් යෝජනා කරනු ලබන ප්‍රතිපත්තිමය නිර්දේශ කිහිපයක් ද මේ සමඟම ඉදිරිපත් කර ඇත.

මෙම නිර්දේශ සකස් කිරීමේ ක්‍රියාවලියේදී පළාත් සභා විසින් ඉදිරිපත් කරන ලද ප්‍රාග්ධන හා පුනරාවර්තන අවශ්‍යතා පළාත් සභා නිලධාරීන් හා ජාතික මට්ටමේ අදාල ආයතනවල නිලධාරීන් ද සමඟ එකතුව සමාලෝචනය කර සමස්ත අරමුදල් අවශ්‍යතාවය නිර්දේශ කරන ලද අතර ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් මුදල් කොමිෂන් සභාවට පැවරී ඇති කාර්යභාරයට අනුකූලව එම අරමුදල් තාර්කික ක්‍රමවේදයකට අනුව පළාත් අතර වෙන් කර දීම පිළිබඳ නිර්දේශ ද මෙම වාර්තාවේ ඇතුළත් වේ.

පළාත් සභා වෙත බලය පවරා ඇති විෂයන්ට අදාල සේවාවන් කාර්යක්ෂමව ලබා දීමට ප්‍රමාණවත් අරමුදල් රජය විසින් පළාත් සභා වෙත ලබා දෙනු ඇතැයි අපේක්ෂා කරන මුදල් කොමිෂන් සභාව ජනතාවගේ සමාජ හා ආර්ථික මට්ටම ඉහළ නංවමින් ප්‍රාදේශීයව පවතින විෂමතාවයන් අවම කිරීම අරමුණු කරගනිමින් මේ සමඟ ඉදිරිත් කර ඇති ප්‍රතිපත්තිමය නිර්දේශ කෙරෙහි ද රජයේ නිසි අවධානය යොමු වනු ඇතැයි ද අපේක්ෂා කරයි.

### 1.2 මුදල් කොමිෂන් සභාවේ කාර්යභාරය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ජ ව්‍යවස්ථාවෙහි මුදල් කොමිෂන් සභාව පිහිටුවීම සඳහා වන ප්‍රතිපාදන සඳහන් වන අතර, මුදල් කොමිෂන් සභාවේ කාර්යභාරය ද පැහැදිලි කර ඇත. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ජ (3), (4) සහ (5) අනුව්‍යවස්ථාවල නිශ්චිතව දක්වා ඇති පරිදි, මුදල් කොමිෂන් සභාවේ කාර්යභාරය පහත ආකාරයෙන් වේ.

154ජ (3) අනුව්‍යවස්ථාව: "පළාත්වල අවශ්‍යතා සපුරාලීම සඳහා ප්‍රමාණවත් අරමුදල්, ආණ්ඩුව විසින් මුදල් කොමිෂන් සභාවේ නිර්දේශය අනුව සහ කොමිෂන් සභාව විමසා වාර්ෂික අයවැය ලේඛනයෙන් වෙන් කර දිය යුත්තේය".

154ජ (4) අනුව්‍යවස්ථාව:

"අ) පළාත් සඳහා ආණ්ඩුව විසින් වාර්ෂිකව ප්‍රදානය කරනු ලබන අරමුදල් පළාත් අතර බෙදාදීමේදී අනුගමනය කළ යුතු ප්‍රතිපත්ති

ආ) පළාත්වල මුදල් කටයුතු සම්බන්ධයෙන් ජනාධිපතිවරයා විසින් කොමිෂන් සභාවට යොමු කරන ලද වෙනත් යම් කාරණයක් සම්බන්ධයෙන් ජනාධිපතිවරයා වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම කොමිෂන් සභාවේ කාර්යය වන්නේය".

154ජ (5) අනුව්‍යවස්ථාව: "රට තුළ තුලිත ප්‍රාදේශීය සංවර්ධනයක් ළඟා කර ගැනීමේ අරමුණින් කොමිෂන් සභාව විසින් ඒ ප්‍රතිපත්ති පිළියෙල කළ යුතු අතර ඒ අනුව,

අ) එක් එක් පළාතේ ජන සංඛ්‍යාව;

ආ) එක් එක් පළාතේ ඒක පුද්ගල ආදායම;

ඇ) විවිධ පළාත් අතර සමාජ හා ආර්ථික විෂමතා අනුක්‍රමිකව අඩු කිරීමේ අවශ්‍යතාවය; හා

ඈ) එක් එක් පළාතේ ඒක පුද්ගල ආදායම සහ පළාත් අතර ඉහළම ඒක පුද්ගල ආදායම අතර වෙනස අනුක්‍රමිකව අඩු කිරීමේ අවශ්‍යතාවය

සැලකිල්ලට ගත යුත්තේය.”

මුදල් කොමිෂන් සභාවේ නිර්දේශ ලැබීමෙන් පසු, ගරු ජනාධිපතිතුමා විසින් එම නිර්දේශ ක්‍රියාත්මක කිරීම හා පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට අවශ්‍ය අනුමැතිය ලබා ගැනීම පිණිස අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කරනු ලබයි. අනතුරුව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ඡ (7) අනු ව්‍යවස්ථාව අනුව ගරු ජනාධිපතිතුමා විසින් එකී නිර්දේශ හා එම නිර්දේශ සම්බන්ධයෙන් ගනු ලැබූ ක්‍රියාමාර්ග පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කෙරේ.

### 1.3 මුදල් කොමිෂන් සභාව විසින් ඉටු කරනු ලබන කාර්යයන්

ඉහත 1.2 හි සඳහන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය ප්‍රතිපාදන අනුව මුදල් කොමිෂන් සභාවේ ප්‍රධාන කාර්යය වනුයේ, පළාත් අවශ්‍යතා සපුරාලීම සඳහා වාර්ෂිකව ජාතික අයවැයෙන් ප්‍රමාණවත් අරමුදල් වෙන් කර ගැනීමට සහ රට තුළ තුලිත ප්‍රාදේශීය සංවර්ධනයක් ළඟා කර ගැනීම පිණිස එම අරමුදල් පළාත් නවය අතර බෙදා හැරීමට අදාල ප්‍රතිපත්ති පිළිබඳව නිර්දේශ රජය වෙත ඉදිරිපත් කිරීමයි. මෙම ක්‍රියාවලියේදී මුදල් කොමිෂන් සභාව විසින් පහත සඳහන් කාර්යයන් ඉටු කරනු ලැබේ.

i. පළාත් සභාවන්හි වාර්ෂිකව සම්පත් අවශ්‍යතා ඇස්තමේන්තු සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම සඳහා පළාත් සභා වෙත මාර්ගෝපදේශ සැපයීම

ii. පළාත් බලධාරීන් සමඟ පවත්වනු ලබන සවිස්තරාත්මක සාකච්ඡා වට ගණනාවකින් අනතුරුව පළාත් සභාවල අවශ්‍යතා තක්සේරු කිරීම

iii. ජාතික අයවැයෙන් පළාත් සභාවලට අවශ්‍ය අරමුදල් වෙන් කිරීම සම්බන්ධයෙන් සහ එම අරමුදල් පළාත් අතර බෙදා වෙන් කිරීම සම්බන්ධයෙන් ගරු ජනාධිපතිතුමා වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම

iv. ගරු ජනාධිපතිතුමාගේ/ආණ්ඩුවේ අනුමැතිය ලැබීමෙන් පසු ජාතික අයවැය මගින් වෙන් කරන ලද අරමුදල් පළාත් සභාවන්හි විවිධ අංශ අතර බෙදා හැරීම

v. අරමුදල් භාවිතයේ කාර්යක්ෂමතාව සහ ඵලදායීතාවය වැඩිදියුණු කිරීමේ අරමුණින් පළාත් වාර්ෂික සංවර්ධන සැලසුම් සැකසීමට අදාල මාර්ගෝපදේශ නිකුත් කිරීම

vi. අදාල පාර්ශ්වකරුවන් සමඟ එක්ව පළාත් සංවර්ධන සැලසුම් සමාලෝචනය කර ඒ සඳහා එකඟතාව ලබා දීම

vii. සංවර්ධන මැදිහත්වීම් සඳහා ජාතික මට්ටමත්, පළාත් මට්ටමත් අතර ආංශික සම්බන්ධීකරණය ප්‍රවර්ධනය කිරීම

viii. පළාත් සේවක සංඛ්‍යාව කළමනාකරණය සම්බන්ධයෙන් රජයට නිර්දේශ සැපයීම

# 2 වන පරිච්ඡේදය

## ශ්‍රී ලංකාවේ මූල්‍ය පාලන බලතල විවිධ මට්ටම්වලට පවරා දීම

### 2.1. 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන සංශෝධනය බලාත්මක වීමත් සමඟ ශ්‍රී ලංකාවේ පරිපාලනමය වශයෙන් පැහැදිලි ස්ථර තුනක් විද්‍යාමාන විය. එනම්, (මධ්‍යම) රජය, පළාත් සභා හා පළාත් පාලන ආයතන වශයෙනි. එමගින් පළාත් සභා මගින් ක්‍රියාත්මක කරනු ලබන ව්‍යවස්ථාමය, විධායක හා මූල්‍ය බලතල සීමාවන් තීරණය කර ඇත. ඒ අනුව, පළාත් සභා විසින් ක්‍රියාත්මක කරනු ලබන විෂයයන් ලැයිස්තුව I ලෙසද (මධ්‍යම) රජය මගින් ක්‍රියාත්මක කරනු ලබන විෂයයන් ලැයිස්තුව II ලෙසද හා රජය හා පළාත් සභා හවුලේ වගකීම් දරන විෂයයන් ලැයිස්තුව III ලෙසද 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ දක්වා ඇත.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ප්‍රතිපාදන අනුව රජය විසින් පළාත් සභා වෙත ලබා දෙනු ලබන අරමුදල් යොදා ගනිමින් පළාත් සභා වෙත පැවරුණු විෂයයන්ට අදාල වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි. ඒ අනුව රජය විසින් මුදල් කොමිෂන් සභාවේ නිර්දේශ අනුව පළාත් සභාවල ප්‍රාග්ධන හා පුනරාවර්තන වියදම් සඳහා ප්‍රමාණවත් අරමුදල් වාර්ෂික අයවැයෙන් වෙන් කර දිය යුතුව ඇත.

පළාත් සභාව විසින් එකතු කරනු ලබන ආදායම්වල ප්‍රභවයන් පිළිබඳ තොරතුරු ද පළාත් සභා ලැයිස්තුවෙහි සඳහන් වන අතර එසේ පළාත් සභා මගින් එකතු කරනු ලබන බදු හා අනෙකුත් ගාස්තු පිළිබඳ සවිස්තරාත්මක තොරතුරු මෙම වාර්තාවේ 3 වන පරිච්ඡේදයෙහි සඳහන් කර ඇත. පළාත් සභා විසින් එකතු කරනු ලබන ආදායම් පළාත් සභාවේ පුනරාවර්තන මූල්‍ය අවශ්‍යතා සපුරා ගැනීමට යොදා ගත්තද එම ආදායම පළාත් සභාවේ සමස්ත වියදම හා සැසඳූ විට ඉතා කුඩා ප්‍රමාණයකි. මහා භාණ්ඩාගාරය විසින් පළාත් සභාවලට පුනරාවර්තන වියදම් සඳහා අරමුදල් ලබා දීමේදී පළාත් සභා විසින් ඉදිරි වර්ෂයේ එකතු කරනු ලබන ආදායම පුරෝකථනය කර එම ප්‍රමාණය පුනරාවර්තන ප්‍රදානයෙන් අඩු කර ලබා දෙන අතර මේ හේතුවෙන් පළාත් සභා විසින් එකතු කරන ලද ආදායම පළාත්වල සංවර්ධන කටයුතු සඳහා යොදා ගැනීමට නොහැකි වී තිබේ.

### 2.2. පළාත් සභා වෙත අරමුදල් ලබා දීමේදී මුදල් කොමිෂන් සභාවේ කාර්යභාරය

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ප්‍රකාරව රජය විසින් පළාත් සභාවල මූල්‍ය අවශ්‍යතා සපුරා ගැනීම සඳහා ප්‍රමාණවත් අරමුදල් ලබාදිය යුතු අතර එම අරමුදල් දිවයිනේ තුලිත ප්‍රාදේශීය සංවර්ධනයක් ඇති කිරීම අරමුණු කරගනිමින් පළාත් අතර තාර්කික ක්‍රමවේදයකට බෙදා දිය යුතුය. ඒ අනුව, මුදල් කොමිෂන් සභාව මේ සම්බන්ධයෙන් ද්විත්ව කාර්යයක් ඉටු කරනු ලබයි.

i. ශ්‍රී ලංකාවේ වර්තමාන ජාතික ප්‍රතිපත්ති, තිරසාර සංවර්ධන අභිමතාර්ථ, ජාතික හා පළාත් ප්‍රමුඛතා ආදිය සැලකිල්ලට ගනිමින් පළාත් සභා විසින් ඉදිරිපත් කරන ලද මූල්‍ය අවශ්‍යතාව විශ්ලේෂණය කරමින් පළාත් මූල්‍ය අවශ්‍යතාවය නිර්ණය කිරීම.

ii. තුලිත ප්‍රාදේශීය සංවර්ධන අරමුණ ළඟා කරගැනීම අරමුණු කරගනිමින් එම අරමුදල් පළාත් අතර බෙදා වෙන් කිරීම

මේ ආකාරයෙන් වෙන් කරනු ලබන අරමුදල් මගින් පළාත් අතර මෙන්ම එක් එක් පළාත තුළ පවතින විෂමතාවයන් අවම කිරීම අපේක්ෂා කෙරේ. පළාත් සභාවල මූල්‍ය අවශ්‍යතා සපුරා ගැනීම සඳහා පහත සඳහන් පරිදි ජාතික අයවැයෙන් ප්‍රදාන ලබා දීම මුදල් කොමිෂන් සභාව විසින් නිර්දේශ කරනු ලබයි.

### 2.2.1 සාමූහික ප්‍රදාන

පළාත් සේවා සැපයුම් පද්ධතිය අඛණ්ඩව පවත්වාගෙන යාම හා වැඩිදියුණු කිරීම සඳහා අවශ්‍ය පුනරාවර්තන වියදම් දැරීම සඳහා ලබා දෙනු ලබන ප්‍රදානය සාමූහික ප්‍රදාන ලෙස හැඳින්වේ. පළාත් රාජ්‍ය සේවයේ කාර්යමණ්ඩල සඳහා වන පුද්ගල පඩිනඩි සාමූහික ප්‍රදානවල ප්‍රධාන සංරචක වන අතර පළාත් රාජ්‍ය සේවයේ කාර්යමණ්ඩලවල වැඩි පිරිසක් අධ්‍යාපන හා සෞඛ්‍ය අංශවල නියුක්ත වීම නිසා එම සංරචකය ඉහළ අගයක් ගනී. ඊට අමතරව පළාත් පාලන ආයතනවලට මාරු කිරීම්, ප්‍රාග්ධන වත්කම් නඩත්තු වියදම්, සමාජ සුබසාධක වියදම්, ගමන් වියදම්, සැපයුම්, ගිවිසුම්ගත සේවා ආදිය සඳහා වන වියදම් සාමූහික ප්‍රදාන යටතේ ඇතුළත් වේ. වැටුප් හා වේතන තක්සේරු කරනු ලබන්නේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කරන ලද කාර්යමණ්ඩල සඳහා පමණි.

### 2.2.2 පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන (PSDG)

පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන ලබා දෙන්නේ පළාත් සභාවලට පැවරී ඇති විෂයයන්ට අදාලව ක්‍රියාත්මක කරනු ලබන සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට අදාළ ප්‍රාග්ධන වියදම් සඳහාය. පළාත් සභා විසින් මෙකී ප්‍රදාන උපයෝගී කරගන්නා ආකාර දැක්වෙන වාර්ෂික සංවර්ධන සැලසුම් සකස් කරනු ලබන අතර එම සැලසුම් සකස් කරනු ලබන්නේ මුදල් කොමිෂන් සභාව විසින් ලබාදෙන මාර්ගෝපදේශ අනුවය. අත්‍යවශ්‍ය සංශෝධනවලට යටත්ව එම සැලසුම් ක්‍රියාත්මක කිරීම සඳහා මුදල් කොමිෂන් සභාවේ එකඟතාවය ලබාදෙනු ලබයි. මෙම සැලසුම් ජාතික ප්‍රතිපත්ති රාමුවට අනුකූලව පළාත් මධ්‍යකාලීන සැලැස්මෙහි අන්තර්ගත ප්‍රමුඛ අවශ්‍යතාවලට සපුරා ගැනීම සඳහා සකස් කරනු ලබයි. මෙකී සැලසුම් ක්‍රියාත්මක කිරීම පසුවිපරම් කිරීම හා ප්‍රතිඵල ඇගයීමට පහසුවන පරිදි මෙම සැලැස්මෙහි ඇතුළත් සෑම ආයෝජනයක් සඳහාම කලින් අර්ථ දක්වන ලද දර්ශකයන්ට අනුව මැනිය හැකි නිමවුම් හා ප්‍රතිඵල හඳුනාගත යුතුය.

2021-22 වර්ෂවල පළාත් සභා සඳහා නිර්දේශ කරන ලද හා පළාත් සභා වෙත නිදහස් කරන ලද අක්මුදල් ප්‍රමාණයන් හා 2023 වර්ෂයට නිර්දේශ කරන ලද පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන පිළිබඳ තොරතුරු පහත වගුව 01 මගින් දක්වා ඇත.

**වගුව 01: පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන සඳහා අයවැය මගින් වෙන් කරන ලද ප්‍රතිපාදන හා නිදහස් කරන ලද අක්මුදල් ප්‍රමාණය (2021-2023)**

**(රු. මි.)**

| පළාත | 2021 | | 2022 | | 2023 |
|---|---|---|---|---|---|
| | අයවැය මගින් වෙන් කිරීම | නිදහස් කරන ලද අක්මුදල | අයවැය මගින් වෙන් කිරීම | නිදහස් කරන ලද අක්මුදල | අයවැය මගින් වෙන් කිරීම |
| බස්නාහිර | 1,256.10 | 690.86 | 836.00 | 418.00 | 1,261.00 |
| මධ්‍යම | 2,440.62 | 1,342.34 | 1,040.00 | 520.00 | 1,889.00 |
| දකුණු | 2,454.41 | 1,349.93 | 971.00 | 485.50 | 1,620.00 |
| උතුරු | 2,988.81 | 1,643.85 | 1,243.00 | 621.50 | 2,190.00 |
| වයඹ | 2,362.00 | 1,299.10 | 1,012.00 | 506.00 | 1,708.00 |
| උතුරුමැද | 2,670.00 | 1,468.50 | 1,227.00 | 613.50 | 1,946.00 |
| ඌව | 2,682.21 | 1,847.05 | 1,250.00 | 625.00 | 2,093.00 |
| සබරගමුව | 2,718.52 | 1,495.19 | 1,132.00 | 566.00 | 2,037.00 |
| නැගෙනහිර | 2,719.25 | 1,495.59 | 1,400.00 | 700.00 | 2,156.00 |
| **එකතුව** | **22,291.92** | **12,632.38** | **10,111.00** | **5,055.50** | **16,900.00** |

2022 හා 2023 වර්ෂ සඳහා එක් එක් අංශය අනුව වෙන්කරන ලද පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන ප්‍රමාණය වගුව 02 මගින් දක්වා ඇත.

**වගුව 02: අංශ අනුව වෙන් කරන පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන ප්‍රමාණය 2022-2023**

**(රු. මි.)**

| අංශය | 2023 | | 2022 | |
|---|---|---|---|---|
| | වෙන් කළ මුදල | % | වෙන් කළ මුදල | % |
| **සමාජ යටිතල පහසුකම්** | **6,554.00** | | **5,325.84** | |
| අධ්‍යාපනය | 2,620 | 15.5 | 2,461.62 | 24.34 |
| සෞඛ්‍යය | 2,000 | 11.83 | 1,920.49 | 18.99 |
| දේශීය වෛද්‍ය | 549 | 3.25 | 336.29 | 3.33 |
| ක්‍රීඩා | 175 | 1.04 | 77.99 | 0.77 |
| පරිවාස හා ළමාරක්ෂක | 494 | 2.92 | 281.14 | 2.78 |
| සමාජ සේවා | 362 | 2.14 | 113.62 | 1.12 |
| සංස්කෘතික හා ආගමික කටයුතු | 98 | 0.58 | 32.65 | 0.32 |
| නිවාස | 154 | 0.91 | 56.1 | 0.55 |
| සමුපකාර | 51 | 0.3 | 13.23 | 0.13 |
| පූර්ව ළමාවිය සංවර්ධනය | 51 | 0.3 | 32.71 | 0.32 |
| **ආර්ථික යටිතල පහසුකම්** | **8,991.00** | | **4,282.79** | |
| පළාත් මාර්ග | 2,951 | 17.46 | 1,759.70 | 17.4 |
| වතු යටිතල පහසුකම් | 159 | 0.94 | 15.66 | 0.15 |
| ප්‍රවාහන | 182 | 1.08 | 82.93 | 0.82 |
| ඉඩම් | 55 | 0.33 | 11.98 | 0.12 |
| කෘෂිකර්මය | 998 | 5.91 | 427.66 | 4.23 |
| පශුසම්පත් | 679 | 4.02 | 291.59 | 2.88 |
| මිරිදිය ධීවර | 209 | 1.24 | 75.03 | 0.74 |
| වාරිමාර්ග | 1,146 | 6.78 | 540.43 | 5.34 |
| ග්‍රාමීය සංවර්ධන | 318 | 1.88 | 91.68 | 0.91 |
| කුඩා කර්මාන්ත | 290 | 1.72 | 141.12 | 1.4 |
| ග්‍රාමීය විදුලිය | 88 | 0.52 | 37.95 | 0.38 |
| සංචාරක | 283 | 1.67 | 107.81 | 1.07 |
| පළාත් පාලන | 1,633 | 9.66 | 699.25 | 6.92 |
| **එකතුව** | **15,545** | | **9,608.63** | |
| නම්‍යශීලී අරමුදල | 988 | 5.85 | 241.47 | 2.39 |
| විශේෂ අවශ්‍යතා සහිත ගම්මාන සඳහා ප්‍රදාන | 367 | 2.17 | 261.42 | 2.59 |
| **මුළු එකතුව** | **16,900.00** | | **10,111.52** | |

### 2.2.3 උපමාන පාදක ප්‍රදාන (CBG)

උපමාන පාදක ප්‍රදාන ද නිර්දේශ කරනු ලබන්නේ ප්‍රාග්ධන වියදම් සඳහා වන අතර ඒවා මූලික වශයෙන් ඉහත කී පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන මගින් අරමුදල් ප්‍රමාණවත් ව වෙන් නොවන අංශවලට අදාල සංවර්ධන කටයුතු සඳහා යොදා ගැනේ. ඒ අනුව උපමාන පාදක ප්‍රදාන ලබා දීමේ අරමුණ වන්නේ ප්‍රාදේශීය විෂමතාවයන් අවම කරමින් පළාත්වල සමාජ හා ආර්ථික තත්ත්වයන් ඉහළ නැංවීමයි. මෙම අරමුදල් පළාත් සභාවේ අභිමතය පරිදි වියදම් කළ හැකි වුවද ඒ සඳහා මුදල් කොමිෂන් සභාව විසින් ලබා දෙන මාර්ගෝපදේශ අනුව කටයුතු කළ යුතුය.

2019-2023 කාලසීමාව තුළ පළාත් සභාවලට නිර්දේශිත උපමාන පාදක ප්‍රදානයන් හා ලබාදුන් අක්මුදල් පිළිබඳ තොරතුරු පහත වගුව 03 මගින් දක්වා ඇත.

**වගුව 03: උපමාන පාදක ප්‍රදාන සඳහා අයවැය මගින් වෙන් කරන ලද ප්‍රතිපාදන හා නිදහස් කරන ලද අක්මුදල් ප්‍රමාණය (2019-2023)**

**(රු. මි.)**

| පළාත | 2019 | | 2020 | | 2021 | | 2022 | | 2023 |
|---|---|---|---|---|---|---|---|---|---|
| | අයවැය මගින් වෙන් කිරීම | නිදහස් කරන ලද අක්මුදල | අයවැය මගින් වෙන් කිරීම | නිදහස් කරන ලද අක්මුදල | අයවැය මගින් වෙන් කිරීම | නිදහස් කරන ලද අක්මුදල | අයවැය මගින් වෙන් කිරීම | නිදහස් කරන ලද අක්මුදල | අයවැය මගින් වෙන් කිරීම |
| බස්නාහිර | 254.00 | 150.00 | 101.40 | 101.40 | 392.00 | 215.60 | 80.00 | 44.80 | 223.00 |
| මධ්‍යම | 389.00 | 248.00 | 202.60 | 202.60 | 560.00 | 308.00 | 190.00 | 106.40 | 333.00 |
| දකුණු | 389.00 | 230.00 | 260.80 | 260.80 | 494.41 | 271.93 | 125.00 | 70.00 | 304.00 |
| උතුරු | 551.00 | 300.00 | 253.81 | 253.81 | 580.82 | 319.45 | 115.00 | 64.40 | 386.00 |
| වයඹ | 408.00 | 230.00 | 155.80 | 155.80 | 508.00 | 279.40 | 201.00 | 112.56 | 301.00 |
| උතුරුමැද | 482.00 | 250.00 | 173.30 | 173.30 | 450.00 | 247.50 | 190.00 | 106.40 | 343.00 |
| ඌව | 559.00 | 317.00 | 194.60 | 194.60 | 560.48 | 308.26 | 165.00 | 92.40 | 369.00 |
| සබරගමුව | 454.00 | 240.00 | 215.20 | 215.20 | 595.00 | 327.25 | 85.00 | 47.60 | 360.00 |
| නැගෙනහිර | 514.00 | 255.00 | 194.40 | 194.40 | 511.31 | 281.22 | 180.00 | 100.80 | 381.00 |
| **එකතුව** | **4,000.00** | **2,220.00** | **1,751.91** | **1,751.91** | **4,652.02** | **2,558.61** | **1,331.00** | **745.36** | **3,000.00** |

### 2.2.4 ආදායම් කාර්යසාධන ප්‍රදාන (RPG)

පළාත්වල ආදායම් එකතු කිරීමේ ක්‍රියාවලිය තව දුරටත් දිරි ගැන්වීම සඳහා පළාත් සභා සඳහා ආදායම් කාර්යසාධන ප්‍රදානයක් ලබාදීම මැනවැයි මුදල් කොමිෂන් සභාව විසින් නිර්දේශ කෙරේ. කෙසේ වෙතත් මෙම ප්‍රදානය පවතින මූල්‍ය සීමාවන් හේතුවෙන් මේ වන තෙක් පළාත් සභා වෙත භාණ්ඩාගාරය විසින් ලබා දී නොමැති අතර ලබා දුනහොත් පළාත් සභාවේ අභිමතය පරිදි සංවර්ධන කටයුතු සඳහා මෙම ප්‍රදානය යොදා ගැනීමේ හැකියාව ඇත.

# 3 වන පරිච්ඡේදය

## 2024 වර්ෂය සඳහා පළාත් ප්‍රාග්ධන සහ පුනරාවර්තන අවශ්‍යතා තක්සේරු කිරීම

### 3.1 පළාත් වියදම් අවශ්‍යතා තක්සේරු කිරීමේදී සලකා බලන ලද කරුණු

ජාතික අයවැයෙන් පළාත් සභා වෙත ලබාදෙන ප්‍රදානයන් නිර්දේශ කිරීම සඳහා සිදු කරන ලද අවශ්‍යතා තක්සේරුවේ දී මුදල් කොමිෂන් සභාව පහත සඳහන් කරුණු සලකා බලන ලදී.

අ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ප්‍රතිපාදන, ප්‍රතිපත්ති මාර්ගෝපදේශ සහ අමාත්‍ය මණ්ඩල තීරණ ආදී අනෙකුත් අදාල කරුණු

ආ) පළාත් මධ්‍යකාලීන සංවර්ධන සැලැසුම් තුළින් මෙන්ම පළාත් අධිකාරීන් සමඟ කටයුතු කිරීමේ දී ඉස්මතු වූ ප්‍රමුඛ සංවර්ධන අවශ්‍යතාවයන්

ඇ) 2024 වර්ෂය සඳහා රජයේ ප්‍රදාන අපේක්ෂාවෙන් පළාත් සභා විසින් ඉදිරිපත් කරන ලද ප්‍රාග්ධන සහ පුනරාවර්තන වියදම් අවශ්‍යතා සහ 2023 වර්ෂය සඳහා මෙතෙක් පළාත් සභා වෙත නිකුත් කරන ලද අක් මුදල් ප්‍රමාණය

ඈ) මෑත කාලීන මුදල් කොමිෂන් සභා නිර්දේශ සහ එම නිර්දේශයන්ට අදාලව ගරු ජනාධිපතිතුමා සහ කැබිනට් මණ්ඩලය විසින් ලබා දී ඇති නිරීක්ෂණ හා තීරණ

ඉ) පළාත්වල සමාජ-ආර්ථික තත්ත්වය

ඊ) සාධාරණ පරිදි ප්‍රතිලාභ බෙදී යන තුලිත ප්‍රාදේශීය සංවර්ධනයක් සඳහා වූ අවශ්‍යතාවයන්

උ) පාර්ශ්වකරුවන් සමඟ එක්ව පවත්වන ලද සාකච්ඡාවන්හි දී මතුවූ කරුණු සහ ඇතැම් අධ්‍යයනයන් මගින් සොයාගත් කරුණු

තුලිත ප්‍රාදේශීය සංවර්ධනය සඳහා පළාත් සභා වෙත වෙන් කර ඇති අරමුදල් ප්‍රමාණවත් නොවීම සැලකිල්ලට ගනිමින්, පළාත් සභා සඳහා ප්‍රාග්ධන ප්‍රතිපාදන වෙන් කිරීම, ජාතික අයවැයේ ඇස්තමේන්තුගත මුළු ප්‍රාග්ධන ආයෝජනයෙන් අවම වශයෙන් 20%ක් විය යුතු බව මුදල් කොමිෂන් සභාව මෑත වසරවල දී සිය නිර්දේශ මගින් ඉදිරිපත් කර ඇත. මෙම ප්‍රදාන වෙන් කිරීමේදී, බලය බෙදීමේ රාමුව, රජය විසින් ප්‍රකාශයට පත් කරන ලද ජාතික ප්‍රතිපත්ති මෙන්ම තිරසාර සංවර්ධන ඉලක්ක ද සැලකිල්ලට ගත යුතුය. වත්මන් ආර්ථික පසුබෑම තුළ අයවැය ප්‍රතිපාදන ලබාදීමේ සීමාවන් ද සැලකිල්ලට ගෙන, රේඛීය අමාත්‍යාංශ සහ පළාත් සභා අතර ව්‍යාපෘති ද්විකරණය නොවන පරිදි ව්‍යාපෘති ප්‍රමුඛතා හඳුනා ගැනීම ඉතා වැදගත් වේ. ඒ අනුව, පළාත් සභා විශේෂ වියදම් ඒකක ලෙස සලකා ප්‍රධාන ලේකම්වරුන් ප්‍රධාන ගණන් දීමේ නිලධාරීන් ලෙස නම් කරමින් පළාත් සභා වෙත සෘජුව මුදල් වෙන් කළ යුතු බවට පසුගිය වසරේදී අවධාරණය කළ කාරණය එලෙස ම මෙම වසරේදීත් නිර්දේශ කෙරේ.

### 3.2 පළාත් සභාවල ප්‍රාග්ධන වියදම් අවශ්‍යතා ඉදිරිපත් කිරීම හා මුදල් කොමිෂන් සභාවේ තක්සේරුව

2024 වර්ෂයට අදාල ප්‍රාග්ධන අවශ්‍යතා හඳුනා ගැනීම සඳහා මුදල් කොමිෂන් සභාව විසින් 2023 මාර්තු 03 වන දින පළාත් සභා වෙත මාර්ගෝපදේශ නිකුත් කරන ලදී. එම මාර්ගෝපදේශ මත පදනම්ව පළාත් සභා තම වාර්ෂික ප්‍රාග්ධන අවශ්‍යතා, රජයේ ප්‍රදාන ලෙස ජාතික අයවැයෙන් ලබා ගැනීමේ අපේක්ෂාවෙන් සකස් කර ඉදිරිපත් කර ඇත.

රජයේ සංවර්ධන උපාය මාර්ග හා තිරසාර සංවර්ධන අභිමතාර්ථයන්ට අනුගත වෙමින් හා පළාතට සුවිශේෂී වූ අවශ්‍යතා සැලකිල්ලට ගනිමින් පළාත් සභා විසින් පිළියෙල කොට ඇති විස්තරාත්මක මධ්‍ය කාලීන සංවර්ධන සැලැස්ම, පළාත් සම්පත් අවශ්‍යතා තක්සේරුව සඳහා මූලිකව පදනම් කර ගන්නා ලදී. මධ්‍ය කාලීන සැලසුම්වල ඉලක්ක සහ කාල රාමු සැලකිල්ලට ගෙන, විවිධ අරමුදල් මූලාශ්‍රවලින් මූල්‍යකරණය යටතේ වාර්ෂික ක්‍රියාත්මක කිරීමේ සැලැස්මේ වියදම් අවශ්‍යතා හඳුනාගෙන ඇත. ඒ අනුව, පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන (PSDG) ආකාරයෙන් ජාතික අයවැයෙන් ලැබෙන අරමුදල් භාවිතා කර, පළාත් සභාවල සංවර්ධන සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අරමුණින් ඉදිරි වර්ෂය සඳහා වන ප්‍රාග්ධන වියදම් අවශ්‍යතාවය සකස් කර ඇත.

සියලුම පළාත් සභා තම ප්‍රාග්ධන අරමුදල් අවශ්‍යතා පහත අංශ යටතේ ඉදිරිපත් කර ඇති, යම් පළාතකට නිසි සාධාරණීකරණයන් සහිතව විශේෂිත අවශ්‍යතා සඳහා අමතර අංශ ද ඇතුළත් කොට ඇත.

- අධ්‍යාපන
- සෞඛ්‍ය
- දේශීය වෛද්‍ය
- පළාත් මාර්ග
- වාරිමාර්ග
- කෘෂිකර්ම
- සත්ව නිෂ්පාදන
- මිරිදිය ධීවර කර්මාන්ත
- කුඩා කර්මාන්ත
- ක්‍රීඩා
- පරිවාස හා ළමාරක්ෂක
- සමාජ සේවා
- සංස්කෘතික හා ආගමික කටයුතු
- සමුපකාර සංවර්ධන
- මුල් ළමාවිය සංවර්ධන
- වතු යටිතල පහසුකම්
- ප්‍රවාහන
- නිවාස
- ග්‍රාමීය විදුලිය
- පළාත් පාලන
- සංචාරක
- ග්‍රාමීය සංවර්ධන
- ඉඩම් සංවර්ධන

එක් එක් අංශ අතර ප්‍රතිපාදන වෙන් කිරීමේදී ඉහත සඳහන් විෂයන්ට අතිරේකව එකී අංශ මඟින් ආවරණය නොවන එහෙත් එකී අංශවල අඩුපාඩු සපුරාලීම සඳහා යොදාගත හැකි නම්‍යශීලී ප්‍රතිපාදන සහ විශේෂ සංවර්ධන අවශ්‍යතා සඳහා ප්‍රතිපාදනයක් ද වෙන් කෙරෙනු ඇත.

### 3.3 2024 වර්ෂය සඳහා ප්‍රාග්ධන වියදම් අවශ්‍යතා තක්සේරු කිරීම

බහු ආංශික ඒකාබද්ධ ප්‍රවේශයක් අනුගමනය කරමින් මැදි කාලීන ආංශික ප්‍රතිඵල රාමුවක් මත සවිස්තරාත්මකව සකස් කර ඇති පළාත් පස් අවුරුදු සංවර්ධන සැලසුම් පළාත් සභා සතුව ඇත. පළාත් ආංශික ප්‍රාග්ධන වියදම් අවශ්‍යතා මූලික වශයෙන් හඳුනා ගෙන ඇත්තේ එකී මැදි කාලීන සැලැස්ම ඇසුරිනි. ගරු ආණ්ඩුකාරවරුන්, ප්‍රධාන ලේකම්වරුන්ගේ සහ අනෙකුත් අදාල පළාත් බලධාරීන්ගේ උපදෙස් ලබා ගනිමින් ආංශික අවශ්‍යතා තක්සේරු කිරීමේ වගකීම පැවරී ඇත්තේ පළාත් සභාවන්හි තාක්ෂණික දැනුම ඇති අදාළ ඒකක වෙතය. තිරසාර සංවර්ධන අරමුණු සහ ඉලක්ක, පළාතේ එක් එක් ප්‍රදේශ තුළ හා ප්‍රදේශ අතර දක්නට ලැබෙන විෂමතා, ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ සූදානම සහ ඒවායේ ශක්‍යතා, රේඛීය අමාත්‍යාංශ හා රජයේ ආයතන විසින් ක්‍රියාත්මක කරනු ලබන විශේෂ සංවර්ධන වැඩසටහන්, ප්‍රාග්ධන ආයෝජන සම්බන්ධයෙන් නිකුත් කරන ලද මාර්ගෝපදේශ සහ චක්‍රලේඛ මඟින් ලබා දී ඇති රජයේ මඟ පෙන්වීම, ආර්ථික අර්බුදයේ ප්‍රතිඵල සහ බලපෑම, වසංගත තත්ත්වයන් සහ පළාත්වල භෞතික හා මානව සම්පත් ප්‍රශස්ත ලෙස භාවිතා කිරීමේ අවශ්‍යතා කෙරෙහි තවදුරටත් නිසි අවධානය යොමු කර ඇත.

පළාත් බද ආර්ථික යටිතල පහසුකම් සහ සමාජ යටිතල පහසුකම් ක්ෂේත්‍රවල රාජ්‍ය ආයෝජන සිදුකිරීම පුද්ගලික අංශයේ සම්පත් ප්‍රශස්ත ලෙස භාවිතා කිරීම සඳහා වන ප්‍රධාන අවශ්‍යතාවයකි. මේ අනුව, භෞතික යටිතල පහසුකම් අලුත්වැඩියා කිරීමේ ප්‍රමුඛතම සංවර්ධන අවශ්‍යතා, නිම කළ යුතු අවිච්ඡේද වැඩ, ආයතනික හා ප්‍රතිලාභී ධාරිතාව සංවර්ධනය, තක්සේරු කරන ලද ප්‍රාග්ධන අවශ්‍යතාවලට ඇතුළත් වේ. නව ඉදිකිරීම් ව්‍යාපෘති ආරම්භ නොකිරීම පිළිබඳ රජයේ ප්‍රතිපත්තියට අනුගත වෙමින් පරිපාලන කටයුතු සඳහා යොදා ගන්නා ගොඩනැගිලි ඉදිකිරීම් සඳහා ඉදිරිපත් වූ ප්‍රතිපාදන ඉල්ලීම් මෙවර ප්‍රාග්ධන අවශ්‍යතාවයන්ට ඇතුළත් නොකරන ලදි.

ඉහත සඳහන් නිර්දේශය අනුව පළාත් ආදායම ප්‍රාග්ධන ප්‍රදානය වෙනුවට හිලව් කිරීමේදී එසේ ගැලපිය යුතු ආදායම එක් එක් පළාත් සභාවේ ආදායම අනුව වෙනස් වේ. ඇමුණුම 01 මඟින් පෙන්වා ඇති පරිදි, ආදායම් ඉලක්ක රු. මි. 1025 සිට රු. මි. 9200 ක් වන අතර, එහි ප්‍රතිඵලයක් ලෙස පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදානය සඳහා ගළපන ලද ආදායම් පරාසය රු. මි. 1000 සිට රු. මි. 1750 දක්වා වේ. නැගෙනහිර පළාත් සභාව අවම ඉලක්කය වන රු. මිලියන 1025 තක්සේරු කර ඇති අතර, එයින් රු. මි. 1000 (97.56%) ක් පළාත් නිශ්චිත සංවර්ධන අරමුදල සමඟ ගලපනු ලැබේ. බස්නාහිර පළාත් සභාව රුපියල්. මි. 9200 ක් ආදායම් වශයෙන් උපයනු ඇතැයි තක්සේරු කරන අතර, එයින් පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන සඳහා රු. මි. 1750 (19.02%) ක ගැළපීමක් සිදු කෙරේ.

කෙසේ වෙතත්, පුනරාවර්තන වියදම් කෙරෙහි මෙම යෝජනාවේ බලපෑම අවම කිරීම සඳහා, 2024 වර්ෂය සඳහා තක්සේරු කරන ලද පළාත් ආදායමෙන් 50% ක් ප්‍රාග්ධන ප්‍රදානයට ගැළපීමටත් ඉතිරි 50% පුනරාවර්තන ප්‍රදානයෙන් වියදම් පියවා ගැනීම මැනවැයි මුදල් කොමිෂන් සභාව විසින් නිර්දේශ කෙරේ.

ඇමුණුම 01 හි දක්වා ඇති සංයුක්ත දර්ශකයට අනුව පළාත් සභා අතර ප්‍රාග්ධන අරමුදල් (භාණ්ඩාගාරය විසින් වෙන් කරනු ලබන ප්‍රාග්ධන ප්‍රදානය සහ ප්‍රාග්ධන ප්‍රදානය සමඟ පළාත් ආදායම ගැලපීම මගින් ලබා ගත හැකි මුදල යන දෙකෙහි එකතුව බෙදා දෙනු ලබන බැවින්) මෙම යෝජනාව හේතුවෙන් කිසියම් පළාතකට අනවශ්‍ය ප්‍රතිලාභයක් නොලැබෙන බවට මුදල් කොමිෂන් සභාවට සහතික විය හැක. ඒ අනුව, පළාත් ආදායම ගැලපීමෙන් පසු අයවැයෙන් වෙන් කර දෙනු ලබන පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදානයෙන් ඉතිරි මුදල පමණක් පළාත් වෙත මාරු කරනු ලැබේ. පළාත් සභාවලට වෙන් කෙරෙන මුළු මුදල හරහා සිදු කෙරෙන ප්‍රාග්ධන වියදම් මුදල් කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශවලට අනුව සකස් කර එහි එකඟතාව ඇතිව ක්‍රියාත්මක කරන වාර්ෂික සංවර්ධන සැලසුම්වලට ඇතුළත් කරන බව ද සඳහන් කළ යුතු ව ඇත. ප්‍රාග්ධන ප්‍රදානය, පළාත් ආදායම සමඟ ගැලපීමේ අවශ්‍යතාවය සහ එමගින් පළාත් සභාවලට නොපමාව වියදම් දැරීමට අවශ්‍ය යම් මුදලක් ලබා දීමේ අවශ්‍යතාවය තදින්ම දැනුණේ 2023 වර්ෂයේදී පළාත් සභා මගින් ක්‍රියාත්මක කරනු ලබන පාසල් පෝෂණ වැඩසටහන යටතේ ප්‍රාග්ධන ස්වභාවයේ කුඩා ක්‍රියාකාරකම්වල පිරිවැය පියවා ගැනීමට පවා පළාත් බලධාරීන්ට ප්‍රතිපාදන නොතිබූ බැවිනි.

මීට අතිරේකව 2024 වර්ෂය සඳහා රු. බිලියන 15.0 ක උපමාන පාදක ප්‍රදානයක් ලබා දීමත් (කරුණාකර 2.2.3 ඡේදය බලනු මැනවි) රු. බිලියන 3 ක ආදායම් කාර්යසාධන ප්‍රදානයක් (කරුණාකර 2.2.4 ඡේදය බලනු මැනවි) ලබා දීමත් මැනවැයි මෙම කොමිෂන් සභාව විසින් නිර්දේශ කෙරේ.

### 3.4 2024 වර්ෂය සඳහා සාමූහික ප්‍රදාන තක්සේරු කිරීම

2023 ජනවාරි 27 වැනි දින මුදල් කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශවලට අනුව පළාත් සභා විසින් ඉදිරිපත් කරන ලද සිය ඉල්ලීම් පරීක්ෂා කිරීමෙන් පසු පළාත්වල පුනරාවර්තන අවශ්‍යතා තක්සේරු කරන ලද අතර, ඉන් අනතුරුව මහා භාණ්ඩාගාරයේ නිලධාරීන්ගේ ද සහභාගීත්වයෙන් පළාත් නිලධාරීන් සමඟ අයවැය සාකච්ඡා පවත්වන ලදී.

2024 වසර සඳහා පුනරාවර්තන අවශ්‍යතා තක්සේරු කිරීම පහත සඳහන් කරුණු මත පදනම් වේ.

01. කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව (DMS) විසින් 2023.03.31 දිනට අනුමත කරන ලද මුළු පළාත් සේවක සංඛ්‍යාව මූලික පදනම වුවත් අයවැය ඇස්තමේන්තු සඳහා ඇතුළත් කර ඇති මුළු සේවක සංඛ්‍යාව අනුමත සේවක සංඛ්‍යාව ඉක්මවා ගිය අවස්ථා ඇත. ඒ සඳහා සමහර පළාත් සභා ආයතනවල සිටින සේවක සංඛ්‍යාව, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කර ඇති සේවක සංඛ්‍යාවට වඩා වැඩි වීම හේතු වී ඇත. කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කරන ලද සේවක සංඛ්‍යාව ද එම දෙපාර්තමේන්තුව විසින් මෙතෙක් අනුමත කර නොමැති තනතුරුවල සිටින සංවර්ධන නිලධාරීන් හා බහු කාර්ය සංවර්ධන සහායකයන්ට ද අදාල පුද්ගල පඩිනඩි පමණක් තක්සේරු කර නිර්දේශ කෙරේ .

02. ප්‍රධාන වශයෙන් සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, අධ්‍යාපන යනාදී අමාත්‍යාංශ මගින් දැනටමත් පළාත් සභා සඳහා යොදවා ඇති/ අනුයුක්ත කර ඇති සේවක සංඛ්‍යාව සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීමේ ක්‍රියා පටිපාටිවල ප්‍රමාදයන් පවතින බව පළාත් නිලධාරීන් සහ භාණ්ඩාගාර නිලධාරීන් සමඟ පැවති අයවැය සාකච්ඡාවේදී නිරීක්ෂණය විය. කෙසේ වෙතත්, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය අපේක්ෂාවෙන් අදාල අමාත්‍යාංශ මගින් පළාත් සභා වෙත නිකුත් කරන ලද කාර්යමණ්ඩල අනුයුක්ත කිරීමේ ලිපි මගින් ලබාදී ඇති නිර්දේශ/තීරණ තක්සේරුවේදී තාවකාලිකව පිළිගැනීමට මුදල් කොමිෂන් සභාවට සිදුවේ.

03. පළාත් සභාවලට තේරී පත්වන සාමාජිකයින් සඳහා වන සභික දීමනා සහ ඔවුන්ගේ පුද්ගලික කාර්ය මණ්ඩලයේ පුද්ගල පඩිනඩි ඇස්තමේන්තු කරන ලද්දේ ජනාධිපති ලේකම් කාර්යාලය විසින් නිකුත් කර ඇති චක්‍රලේඛ අනුවය

04. රජය විසින් වරින් වර නිකුත් කරනු ලබන චක්‍රලේඛ සහ උපදෙස්වල බලපෑම

05. රජයේ ප්‍රමුඛතා වැඩසටහන යටතේ බඳවාගත් රැකියා විරහිත උපාධිධාරීන් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියට යටත්ව දැනටමත් ස්ථිර කර ඇත. එබැවින්, පළාත් රාජ්‍ය අංශයේ ඇති කිරීමට නියමිත එහි ඉතිරි පිරිස සඳහා වූ ප්‍රතිපාදන නිර්දේශ කර ඇත්තේ එම තනතුරු, අතිරික්ත තනතුරු ලෙස සලකමින්ය.

06. පවතින පුරප්පාඩු සඳහා බහු කාර්ය සංවර්ධන සහයකවරුන් (10,494) අන්තර්ග්‍රහණය කිරීම සඳහා පළාත් රාජ්‍ය අංශයේ සහ පළාත් පාලන ආයතනවල අතිරික්ත තනතුරු ලෙස ඇති කිරීමට නියමිත එම තනතුරු සඳහා අවශ්‍ය අරමුදල් තක්සේරුව සඳහා ගෙන ඇත.

07. පාසල් 1000 සංවර්ධන වැඩසටහන යටතේ ජාතික පාසල් ලෙස උසස් කිරීමට නියමිත පළාත් පාසල්වල කාර්ය මණ්ඩලයේ 2024 වසර සඳහා වන ප්‍රතිපාදන අවශ්‍යතාවය, අධ්‍යාපන අමාත්‍යාංශය විසින් ඉල්ලීම් කර එකඟ වූ පරිදි පළාත් සභා යටතේ ඇතුළත් කරන ලදී.

08. 2024 වර්ෂය සඳහා අතිකාල සහ නිවාඩු දින වැටුප් අවශ්‍යතාවය, සත්‍ය සේවක සංඛ්‍යාවේ ඒක පුද්ගල පිරිවැය සහ මෑත කාලීන සත්‍ය වියදම් රටාව සැලකිල්ලට ගනිමින් තක්සේරු කරන ලදී. (පසුගිය වසරට සාපේක්ෂව අතිකාල සහ නිවාඩු දින වැටුප් සඳහා පළාත්වලට ඉදිරිපත් වන ඉල්ලීම් විශාල ලෙස ඉහළ ගොස් ඇත).

09. පළාත් පාලන ආයතනවල අනුමත සේවක සංඛ්‍යාවේ වැටුප් ප්‍රතිපූරණය සහ සාමාජිකයින්ගේ දීමනා ගෙවීම සඳහා තක්සේරු කරන ලද මාරු කිරීම් ප්‍රමාණය රු. 35,891,141,000 "වෙනත් පුනරාවර්තන වියදම්" යටතට ඇතුළත් ඇත. (වගුව 4 )

10. පළාත් ව්‍යවස්ථාපිත ආයතන තුනකට පැවරී ඇති කාර්යයන්හි වැදගත්කම සලකා බලා මුදල් කොමිෂන් සභාව විසින් 2018.04.25 දින ගන්නා ලද තීරණයට අනුව, ඒවායේ කාර්ය මණ්ඩලවලට වැටුප් ගෙවීම සඳහා පමණක් ප්‍රතිපාදන නිර්දේශ කළ අතර, එයට පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය (PRDA), පළාත් මගී ප්‍රවාහනය අධිකාරිය (PPTA) සහ මුල් ළමාවිය සංවර්ධන අධිකාරිය (ECDA) අතුළත් වේ.

11. එදිනෙදා නඩත්තු අවශ්‍යතා සඳහා ප්‍රමාණවත් අරමුදල් වෙන් වන බව සහතික කිරීම පිණිස සාමාන්‍ය නඩත්තුව සඳහා වන වියදම් අතීතයේ දී සිදු කරන ලද පරිදි (අනෙකුත් පුනරාවර්තන වියදම් යටතේ නොදක්වා ) වෙන වෙනම තක්සේරු කර ඇත. මාර්ග, වාරිමාර්ග යටිතල පහසුකම් සහ විශේෂයෙන්ම අධ්‍යාපන, සෞඛ්‍ය, වාරිමාර්ග, කෘෂිකර්ම සහ අනෙකුත් අංශවල ගොඩනැගිලි සහ ඉදිකිරීම් නඩත්තු ඇතුළු පළාත් වත්කම් අලුත්වැඩියා කිරීම සහ ප්‍රතිසංස්කරණය කිරීම සඳහා අත්‍යවශ්‍ය සහ තීරණාත්මක අවශ්‍යතා මත වත්කම් නඩත්තු කිරීම සලකා බලන ලදී.

12. අධ්‍යාපන, සෞඛ්‍ය සහ අනෙකුත් අංශ සඳහා හිඟ වැටුප් රු. 2,394,137,000 කි.

13. අනෙකුත් පුනරාවර්තන වියදම්, ළමා නිවාස, වැඩිහිටි නිවාස සහ පිළිකා, වකුගඩු, ක්ෂය රෝගීන් සඳහා තක්සේරු කරන ලද සමාජ සුබසාධන වියදම් වලින් ද සමන්විත වේ.

14. පළාත් බලධාරීන් විසින් සිදු කර ඇති හදිසි අරමුදල සඳහා රු. 3,404,191,000 ක සහ අත්තිකාරම් B ගිණුම් අරමුදල සඳහා රු. 18,336,734,000 ක ඉල්ලීම ද අපගේ නිර්දේශයට ඇතුළත් වේ.

ඒ අනුව, 2024 වර්ෂය සඳහා පළාත් පුනරාවර්තන අවශ්‍යතාවය රු. මි. 514,604.854 කි.

වගුව-04: පළාත් අනුව 2024 වසර සඳහා තක්සේරු කළ පුනරාවර්තන අවශ්‍යතා

(Rs. 000)

| පළාත | 2023.03.31 දිනට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව අනුමත කළ පළාත් සේවක සංඛ්‍යාව | පුද්ගල පඩිනඩි | පුද්ගල පඩිනඩිවල පළාත් කොටස (%) | අනෙකුත් පුනරාවර්තන වියදම් | අනෙකුත් පුනරාවර්තන වියදම් හි පළාත් කොටස (%) | මුළු පුනරාවර්තන වියදම් | මුළු පුනරාවර්තන වියදම් හි පළාත් කොටස (%) |
|---|---|---|---|---|---|---|---|
| (1) | (2) | (3) | (4) | (5) | (6) | (7)= (3) + (5) | (8) |
| බස්නාහිර | 64,761 | 63,041,413 | 16.83 | 25,781,840 | 22.17 | 88,823,253 | 19.06 |
| මධ්‍යම | 53,655 | 49,980,853 | 13.34 | 14,273,074 | 12.27 | 64,253,927 | 11.94 |
| දකුණු | 48,373 | 45,062,975 | 12.03 | 14,610,586 | 12.56 | 59,673,561 | 12.2 |
| උතුරු | 37,260 | 33,429,207 | 8.92 | 10,789,391 | 9.28 | 44,218,598 | 9.1 |
| වයඹ | 50,455 | 46,485,311 | 12.41 | 11,590,073 | 9.97 | 58,075,384 | 11.58 |
| උතුරු මැද | 30,642 | 27,323,381 | 7.29 | 9,721,973 | 8.36 | 37,045,354 | 7.36 |
| ඌව | 35,485 | 31,378,072 | 8.38 | 8,214,474 | 7.06 | 39,592,546 | 8.06 |
| සබරගමුව | 40,753 | 39,588,385 | 10.57 | 10,458,165 | 8.99 | 50,046,550 | 10.82 |
| නැගෙනහිර | 39,724 | 38,288,963 | 10.22 | 10,845,794 | 9.33 | 49,134,757 | 9.88 |
| **මුළු එකතුව** | **401,108** | **374,578,559** | **100** | **116,285,370** | **100** | **490,863,929** | **100** |

| | | |
|---|---|---|
| එකතු කිරීම් | හදිසි අවශ්‍යතා අරමුදල - 2024 | 3,404,191 |
| | අත්තිකාරම් B ගිණුමක් සඳහා ඉල්ලීම - 2024 | 18,336,734 |
| | 2022 වසරේදී සිදු වූ මධ්‍යම පළාත් සභාවේ වියදම් අයකර ගැනීම | 2,000,000 |
| | **තක්සේරු කළ සම්පූර්ණ පුනරාවර්තන අවශ්‍යතා** | **514,604,854** |

*සටහන: 3 තීරුව - සත්‍ය සේවක සංඛ්‍යාව සහ පුරප්පාඩු සඳහා පුද්ගල පඩිනඩි, රේඛීය අමාත්‍යාංශ අනියුක්ත කිරීම් සහ හිඟ වැටුප් ඇතුළත් වේ.*

*5 තීරුව - පළාත් පාලන ආයතනවලට මාරු කිරීම , පාසල් පෝෂණ වැඩසටහන සඳහා වියදම්, පළාත් ව්‍යවස්ථාපිත ආයතන සඳහා පුද්ගල පඩිනඩි ඇතුළත් අතර, පළාත් පාලන ආයතනවලට අයත් මුද්දර ගාස්තු සහ උසාවි දඩ මුදල් ඇතුළත් නොවේ.*

## 3.5 පළාත් ආදායම්

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වැනි සංශෝධනයේ නවවැනි උපලේඛනයේ 1 ලැයිස්තුවේ 36.1 සිට 36.20 දක්වා අයිතමවල පළාත් සභා වෙත පැවරී ඇති ආදායම් මූලාශ්‍ර සඳහන් කර ඇත.

පළාත් ආදායම ප්‍රධාන සංරචක දෙකකින් සමන්විත වේ.

(i.) පළාත් සභාවලට පවරා ඇති මූලාශ්‍රවලින් එකතු කරන ආදායම

(ii.) රජයේ මාරු කිරීම් හරහා ලැබෙන ආදායම

(i) පළාත් සභාවලට පවරා ඇති මූලාශ්‍රවලින් ආදායම් එකතු කිරීම

මෝටර් රථ ආදායම් බලපත්‍ර ගාස්තු, මත්පැන් සඳහා බලපත්‍ර ගාස්තු, මුද්දර ගාස්තු සහ උසාවි දඩ මුදල් පළාත් සභාවල ප්‍රධාන ආදායම් මාර්ග වේ. මෙම ප්‍රධාන මූලාශ්‍රවලින් මුද්දර ගාස්තු සහ උසාවි දඩ මුදල් නීත්‍යානුකූලව පළාත් පාලන ආයතන වෙත මාරු කිරීමට නියමිතය.

අංක 01/2010 රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති චක්‍රලේඛය මගින් 2011 ජනවාරි 1 වන දින සිට ව්‍යාපාර පිරිවැටුම් බද්ද (BTT) අහෝසි කිරීමෙන් පසු පළාත් ආදායම තුළ පළාත් ක්‍රමයේ බදු ආවරණයේ පදනම අඩු වී ඇති අතර, රජයේ ආදායම් මාරු කිරීම වැදගත් වී ඇත.

(ii) රජයේ ආදායම් මාරු කිරීම්

ව්‍යාපාර පිරිවැටුම් බද්ද අහෝසි කිරීම හේතුවෙන් පළාත් ආදායම විශාල ලෙස අඩු විය. 2010 දෙසැම්බර් 29 වැනි දින භාණ්ඩාගාර ලේකම් විසින් නිකුත් කරන ලද අංක 01/2010 රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති චක්‍රලේඛය යටතේ ජාතික අයවැය මගින් හඳුන්වා දෙන ලද විශේෂ ආදායම් බෙදාගැනීමේ ක්‍රමවේදය මගින් මෙම ආදායම් අඩුවීම ප්‍රතිපූරණය කරන ලදි. ඒ සඳහා දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්, රේගු අධ්‍යක්ෂ ජනරාල් සහ මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් වැනි ජාතික මට්ටමේ ආයතන විසින් එකතු කරන ලද ආදායම, 2011 ජනවාරි 10 දින සිට ක්‍රියාත්මක වන පරිදි පහත සඳහන් පදනම මත පළාත් වෙත පැවරිය යුතු වේ. ඒ අනුව, මුද්දර බද්දෙන් 100% ක්, වාහන ලියාපදිංචි ගාස්තු වලින් 70% ක් සහ ජාතිය ගොඩනැගීමේ බද්දෙන් 33 1/3% (NBT) පළාත් සභාවලට මාරු කරන ලද අතර, ජාතිය ගොඩනැගීමේ බද්ද 2019 වසරේ සිට අහෝසි කරන ලදී.

රජයේ ආදායම් මාරු කිරීමේ යාන්ත්‍රණය හඳුන්වා දීමෙන් පසු පළාත් සභාවල ආදායම් ලැබීම ක්ෂණිකව ඉහළ ගිය ද 2019 වසරේ දී ජාතිය ගොඩනැගීමේ බද්ද අහෝසි කිරීම හේතුවෙන් නැවතත් පළාත් ආදායමේ සැලකිය යුතු අඩුවීමක් සිදු විය. රටේ ආදායම වැඩි කිරීම සඳහා ගරු ජනාධිපතිතුමා විසින් එළඹි තීරණයකට අනුව, පසුගිය කාලයේ මෝටර් රථ ආදායම් බලපත්‍ර ගාස්තු ඉහළ දැමීම නිසා පළාත් ආදායමේ වැඩි වීමක් සිදුව ඇත. ඒ අනුව අනෙකුත් ආදායම් මූලයන්ට අදාළ ගාස්තු ද වැඩි කළ යුතුව ඇත.

මුදල් කොමිෂන් සභාව පළාත්වල විමධ්‍යගත ආදායම් ප්‍රභවයන්, එනම් මුද්දර ගාස්තු, උසාවි දඩ, මෝටර් වාහන වාර්ෂික බලපත්‍ර ගාස්තු, සහ සුරාබදු සහ අනෙකුත් ආදායම් සඳහා ආදායම් ඉලක්ක නියම කරයි. රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති චක්‍රලේඛ අංක 01/2010 හි උපදෙස් අනුව රාජ්‍ය ආදායම් එකතු කිරීම්වලින් පළාත්වලට මාරු කළ හැකි මුදල් ප්‍රමාණය තීරණය කරනු ලැබේ. පළාත්වල සාමූහික ප්‍රදානය තීරණය කිරීමේදී මහා භාණ්ඩාගාරය විසින් දිගටම කරගෙන ආ පරිදි 2023 දක්වා පළාතේ අපේක්ෂිත ආදායම පළාතේ සමස්ත පුනරාවර්තන වියදම් අවශ්‍යතාවයෙන් අඩුකර ඇත. මුදල් කොමිෂන් සභාව විසින් ඉදිරි වර්ෂය සඳහා පළාත් ආදායම් සඳහා ඉලක්ක තීරණය කිරීමේදී පළාත් බලධාරීන් විසින් ඉදිරිපත් කරන වාර්ෂික ආදායම් එකතු කිරීමට අදාල තක්සේරුව, ආදායම් එකතු කිරීම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අතීත කාර්යසාධනය සමඟ ද සසඳා බලනු ලැබේ.

ඒ අනුව මුද්දර ගාස්තු සහ උසාවි දඩ මුදල් ඇතුළුව 2024 වර්ෂය සඳහා පුරෝකථනය කරන ලද ආදායම් ප්‍රමාණය රු. මි. 59,606 කි. අදාල පළාත් පාලන ආයතන වෙත මාරු කිරීමට නියමිත මුද්දර ගාස්තු සහ උසාවි දඩ මුදල් හැර 2024 වසර සඳහා පුරෝකථන ආදායම රු. මි. 23,826 කි. පළාත් සභා වෙත පැවරී ඇති ආදායම් ප්‍රභවයන් යටතේ 2024 වසර සඳහා කරන ලද ආදායම් පුරෝකථන වගුව – 05 හි දක්වා ඇත.

වගුව 05: 2024 වසර සඳහා පළාත් සභාවල ආදායම් ඉලක්කය

රු.000'

| පළාත | මත්පැන් සඳහා බලපත්‍ර ගාස්තුව | මෝටර් වාහන ආදායම් බලපත්‍ර ගාස්තු | මුද්දර ගාස්තු | උසාවි දඩ | * වෙනත් | එකතුව (මුද්දර ගාස්තු සහ උසාවි දඩ හැර) | එකතුව (මුද්දර ගාස්තු සහ උසාවි දඩ ඇතුළුව) |
|---|---|---|---|---|---|---|---|
| බස්නාහිර | 700,000 | 5,000,000 | 20,000,000 | 1,500,000 | 3,500,000 | 9,200,000 | 30,700,000 |
| මධ්‍යම | 370,000 | 1,300,000 | 2,000,000 | 135,000 | 700,000 | 2,370,000 | 4,505,000 |
| දකුණු | 130,000 | 1,536,200 | 2,800,000 | 600,000 | 940,000 | 2,606,200 | 6,006,200 |
| උතුරු | 30,000 | 560,000 | 1,300,000 | 400,000 | 750,000 | 1,340,000 | 3,040,000 |
| වයඹ | 120,000 | 1,800,000 | 2,700,000 | 425,000 | 1,300,000 | 3,220,000 | 6,345,000 |
| උතුරු මැද | 55,000 | 750,000 | 220,000 | 550,000 | 650,000 | 1,455,000 | 2,225,000 |
| ඌව | 90,000 | 600,000 | 450,000 | 250,000 | 400,000 | 1,090,000 | 1,790,000 |
| සබරගමුව | 90,000 | 980,000 | 1,100,000 | 300,000 | 450,000 | 1,520,000 | 2,920,000 |
| නැගෙනහිර | 75,000 | 650,000 | 700,000 | 350,000 | 300,000 | 1,025,000 | 2,075,000 |
| එකතුව | **1,660,000** | **13,176,200** | **31,270,000** | **4,510,000** | **8,990,000** | **23,826,200** | **59,606,200** |

***වෙනත් -** *බදු, පොලී, විභාග ගාස්තු, ප්‍රාග්ධන වත්කම් විකිණීම, ඔට්ටු බදු ආදිය ඇතුළත් වේ*

2024 වර්ෂයේ මුළු ආදායමෙන් පළාත් පාලන ආයතන වෙත මාරු කිරීමට තක්සේරු කරන ලද මුද්දර ගාස්තු සහ උසාවි දඩ මුදල් ප්‍රමාණය රු. මි. 35,780 කි. පළාත් පාලන ආයතන සඳහා මාරු කෙරෙන මුද්දර ගාස්තු සහ උසාවි දඩ පළාත් අනුව වගුව - 06 හි දක්වා ඇත.

වගුව 06: 2024 වසර සඳහා පළාත් පාලන ආයතන වෙත මාරු කිරීමට ඇස්තමේන්තු කරන ලද මුද්දර ගාස්තු සහ උසාවි දඩ ඉලක්ක

*(රු. 000)*

| පළාත | මුද්දර ගාස්තු | උසාවි දඩ | එකතුව | පළාත් කොටස (%) |
|---|---|---|---|---|
| බස්නාහිර | 20,000,000 | 1,500,000 | 21,500,000 | 60.09 |
| මධ්‍යම | 2,000,000 | 135,000 | 2,135,000 | 5.97 |
| දකුණු | 2,800,000 | 600,000 | 3,400,000 | 9.50 |
| උතුරු | 1,300,000 | 400,000 | 1,700,000 | 4.75 |
| වයඹ | 2,700,000 | 425,000 | 3,125,000 | 8.73 |
| උතුරු මැද | 220,000 | 550,000 | 770,000 | 2.15 |
| ඌව | 450,000 | 250,000 | 700,000 | 1.96 |
| සබරගමුව | 1,100,000 | 300,000 | 1,400,000 | 3.91 |
| නැගෙනහිර | 700,000 | 350,000 | 1,050,000 | 2.93 |
| **එකතුව** | **31,270,000** | **4,510,000** | **35,780,000** | **100** |

ආදායම් මාරු කිරීමේ යාන්ත්‍රණය හඳුන්වාදීම තුළින් පළාත් ආදායමේ කැපී පෙනෙන වර්ධනයක් සිදු වුවද, 2019 වසරේ දී ජාතිය ගොඩනැගීමේ බද්ද අහෝසි කිරීම හේතුවෙන් පහත වගුවේ දැක්වෙන පරිදි පළාත් ආදායමේ සැලකිය යුතු අඩුවීමක් සිදු විය.

වගුව 07: පළාත් වියදම් සහ ආදායම් ලැබීම් (2016-2022 )

**(රු.මි.)**

| වර්ෂය | මුළු වියදම | එකතු කල ආදායම (මුද්දර ගාස්තු සහ උසාවි දඩ හැර) | රජයේ ආදායම් මාරුකිරීම් | *පළාතේ මුළු ආදායම | ආදායම පළාත් වියදමේ % ලෙස |
|---|---|---|---|---|---|
| **1** | **2** | **3** | **4** | **5=(3+4)** | **6=(5/4)** |
| 2016 | 257,734 | 16,396 | 38,267 | 54,663 | 21 |
| 2017 | 264,158 | 17,425 | 42,491 | 59,916 | 23 |
| 2018 | 281,543 | 18,201 | 45,267 | 63,468 | 23 |
| 2019 | 303,740 | 18,928 | 47,070 | 65,998 | 22 |
| 2020 | 326,418 | 16,767 | 11,240 | 28,007 | 9 |
| 2021 | 342,023 | 18,012 | 10,500 | 28,512 | 8 |
| 2022 | 400,165 | 24,800 | 10,189 | 34,989 | 9 |

** මුද්දර ගාස්තු සහ උසාවි දඩ හැර (පළාත් පාලන ආයතනවලට මාරු කළ යුතු )*

ආදායම් මේ ආකාරයෙන් පහත වැටීම හේතුකොට ගෙන රජයට පළාත් සභා සඳහා ලබාදෙන ප්‍රදාන වැඩි කිරීමට සිදු වනු ඇත. එබැවින්, හැකි ඉක්මනින් පළාත් ආදායම වැඩි කිරීම වැදගත් වන අතර, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වැනි

සංශෝධනයේ පළාත් ලැයිස්තුවේ සඳහන් සියලුම ආදායම් නිසි ලෙස එකතු කර ගැනීමට හැකිවන පරිදි මෙම වාර්තාවේ 7 වන ප්‍රතිපත්ති නිර්දේශයේ සඳහන් පියවර ගත යුතුව ඇත.

තවද, පසුගිය වසරේ අපගේ අංක 12 දරන ප්‍රතිපත්ති නිර්දේශය මගින් පෙන්වා දුන් පරිදි, බොහෝ ආදායම් මූලාශ්‍ර දීර්ඝ කාලයක් තිස්සේ සංශෝධනයකින් තොරව ක්‍රියාත්මක කරගෙන යනු ලැබේ. මෙම හේතුවත් ඇතැම් ආදායම් රේඛීය අමාත්‍යාංශ විසින් පළාත් සභාවලට පැවරිය යුතු ඇතැම් ආදායම් නිසිලෙස නොපැවරීම නිසාත් පළාත් සභාවලට හිමි විය යුතු ආදායම් අහිමි වී ඇත.

2018-2022 කාලසීමාව පළාත් ආදායම් ඉලක්ක, ආදායම් එකතුකිරීම හා සැසඳීම පහත දැක්වේ.

**වගුව 08: පළාත් ආදායම් විෂයන්ට අදාළ ආදායම් ඉලක්ක සහ ආදායම් එකතු කිරීම (2018-2022)**

**(රු.මි.)**

| පළාත | 2018 | | | 2019 | | | 2020 | | | 2021 | | | 2022 | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ඉලක්ක | එකතු කිරීම | % | ඉලක්ක | එකතු කිරීම | % | ඉලක්ක | එකතු කිරීම | % | ඉලක්ක | එකතු කිරීම | % | ඉලක්ක | එකතු කිරීම | % |
| බස්නාහිර | 23,725 | 25,449 | 107 | 26,385 | 21,987 | 83 | 26,750 | 19,521 | 73 | 25,400 | 28,285 | 111 | 23,175 | 35,295 | 152 |
| මධ්‍යම | 3,492 | 3,860 | 111 | 4,078 | 3,677 | 90 | 4,195 | 3,304 | 79 | 4,650 | 3,953 | 85 | 3,940 | 4,615 | 117 |
| දකුණු | 4,010 | 4,379 | 109 | 4,366 | 4,580 | 105 | 4,550 | 4,359 | 96 | 4,846 | 5,304 | 109 | 4,037 | 5,954 | 147 |
| උතුරු | 1,220 | 1,784 | 146 | 1,580 | 1,990 | 126 | 1,860 | 2,074 | 112 | 2,135 | 2,313 | 108 | 2,345 | 2,948 | 126 |
| වයඹ | 4,340 | 4,417 | 102 | 4,707 | 4,678 | 99 | 4,970 | 4,438 | 89 | 5,110 | 5,825 | 114 | 5,252 | 7,012 | 134 |
| උතුරු මැද | 1,490 | 1,674 | 112 | 1,541 | 1,691 | 110 | 1,826 | 1,904 | 104 | 1,951 | 1,888 | 97 | 1,812 | 2,180 | 120 |
| ඌව | 1,570 | 1,472 | 94 | 1,495 | 1,389 | 93 | 1,605 | 1,416 | 88 | 1,640 | 1,604 | 98 | 1,629 | 1,760 | 108 |
| සබරගමුව | 2,245 | 1,734 | 77 | 2,195 | 2,720 | 124 | 2,275 | 2,350 | 103 | 2,500 | 2,508 | 100 | 2,477 | 2,810 | 113 |
| නැගෙනහිර | 1,520 | 1,585 | 104 | 1,640 | 1,523 | 93 | 1,725 | 1,637 | 95 | 1,780 | 1,770 | 99 | 1,752 | 2,057 | 117 |
| **එකතුව** | **43,612** | **46,354** | 106 | **47,987** | **44,235** | 92 | **49,756** | **41,003** | 82 | **50,012** | **53,450** | 107 | **46,419** | **64,631** | 139 |

**මුද්දර ගාස්තු සහ උසාවි දඩ ඇතුළු ආදායම් එකතු කිරීම් සහ ඉලක්ක*

රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව විසින් ඇස්තමේන්තු කර ඇති රාජ්‍ය ආදායමෙන් පළාත් සභා වෙත මාරු කිරීමට අදාල අගයන් පළාත් ආදායම් තක්සේරුව සඳහා සැලකිල්ලට ගෙන ඇත. එකී ආදායම් ඉලක්ක සහ එකී ආදායම පළාත් සභා වෙත මාරු කිරීම පිළිබඳ තොරතුරු පහත වගුවේ දැක්වේ. ඒ අනුව පළාත් ආදායම් කොටස සම්පූර්ණයෙන්ම පළාත් සභා වෙත පවරා නොමැති බව 9 වන වගුවෙන් පැහැදිලි වේ.

**වගුව: 09  භාණ්ඩාගාරයෙන් ආදායම් පළාත් සභා වෙත මාරු කිරීම - ඉලක්ක සහ නිදහස් කරන ලද ප්‍රමාණය (2018-2022)**

**(රු. මි.)**

| පළාත | 2018 | | | 2019 | | | 2020 | | | 2021 | | | 2022 | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ඉලක්ක | නිදහස් කිරීම | % | ඉලක්ක | නිදහස් කිරීම | % | ඉලක්ක | නිදහස් කිරීම | % | ඉලක්ක | නිදහස් කිරීම | % | ඉලක්ක | නිදහස් කිරීම | % |
| බස්නාහිර | 26,400 | 21,659 | 82 | 30,624 | 22,936 | 75 | 30,624 | 4,916 | 16 | 6,720 | 5,001 | 74 | 6,720 | 4,734 | 70 |
| මධ්‍යම | 4,950 | 4,062 | 82 | 5,742 | 4,159 | 72 | 5,742 | 1,137 | 20 | 1,260 | 952 | 76 | 1,260 | 897 | 71 |
| දකුණු | 4,950 | 4,115 | 83 | 5,742 | 4,175 | 73 | 5,742 | 1,133 | 20 | 1,260 | 951 | 75 | 1,260 | 893 | 71 |
| උතුරු | 2,750 | 2,222 | 81 | 3,190 | 2,387 | 75 | 3,190 | 517 | 16 | 700 | 513 | 73 | 700 | 531 | 76 |
| වයඹ | 4,950 | 4,136 | 84 | 5,742 | 4,200 | 73 | 5,742 | 1,180 | 21 | 1,260 | 954 | 76 | 1,260 | 1,096 | 87 |
| උතුරු මැද | 2,750 | 2,287 | 83 | 3,190 | 2,188 | 69 | 3,190 | 638 | 20 | 700 | 538 | 77 | 700 | 500 | 71 |
| ඌව | 2,750 | 2,236 | 81 | 3,190 | 2,290 | 72 | 3,190 | 609 | 19 | 700 | 522 | 75 | 700 | 493 | 70 |
| සබරගමුව | 2,750 | 2,296 | 83 | 3,190 | 2,336 | 73 | 3,190 | 580 | 18 | 700 | 536 | 77 | 700 | 504 | 72 |
| නැගෙනහිර | 2,750 | 2,254 | 82 | 3,190 | 2,399 | 75 | 3,190 | 530 | 17 | 700 | 533 | 76 | 700 | 539 | 77 |
| එකතුව | **55,000** | **45,267** | **82** | **63,800** | **47,070** | **74** | **63,800** | **11,240** | **18** | **14,000** | **10,500** | **75** | **14,000** | **10,187** | **73** |

මූලාශ්‍රය: රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ වාර්තා හා පළාත් ආදායම් එකතු කිරීමේ වාර්තා

# 4 වන පරිච්ඡේදය

## 2024 වර්ෂය සඳහා රජයේ ප්‍රදාන පළාත් සභා අතර වෙන් කර දීම පිළිබඳ නිර්දේශ

### 4.1 ප්‍රාග්ධන ප්‍රදාන බෙදීම පිළිබඳ නිර්දේශය

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ජ (4)(අ) ව්‍යවස්ථාවට අනුව, රට තුළ තුලිත ප්‍රාදේශීය සංවර්ධනය ළඟා කර ගැනීමේ අරමුණින් පළාත් අතර අරමුදල් වෙන් කර දීම පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කිරීම මුදල් කොමිෂන් සභාවට පැවරී ඇත. මේ අනුව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ අදාළ ප්‍රතිපාදන ගැන ද සැලකිලිමත් වෙමින් වඩාත් අර්ථාන්විත පරිදි පළාත් අතර ප්‍රාග්ධන අරමුදල් බෙදා හැරීම සඳහා උපයෝගී කරගත යුතු මෙහි 10 වන වගුවේ සඳහන් සංයුක්ත දර්ශකය මුදල් කොමිෂන් සභාව ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව සමඟ එක්ව පහත සඳහන් පළාත් මට්ටමේ විචල්‍යයන් ඇතුළත් කර ''සාධක විශ්ලේෂණය'' නම් බහුවිධ සංඛ්‍යාන ක්‍රමවේදයක් අනුගමනය කරමින් සංඛ්‍යානමය සූත්‍රයක් ආශ්‍රයෙන් සකස් කර ඇත.

- පළාත් මධ්‍ය වාර්ෂික ජනසංඛ්‍යාව
- පළාතේ භූමි ප්‍රමාණය
- පළාත් දළ දේශීය නිෂ්පාදිතය
- පළාතේ දිළිඳු ජනසංඛ්‍යාව
- පළාතේ මධ්‍යයන ඒක පුද්ගල ආදායම
- පළාතේ එක් වෛද්‍ය නිලධාරියෙකුට (බටහිර වෛද්‍යවරයෙකුට) සිටින පුද්ගලයින් සංඛ්‍යාව
- පළාතේ විද්‍යා විෂය ධාරාවෙන් විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලැබූ සිසුන්ගේ ප්‍රතිශතය

ඉහත සඳහන් විචල්‍යයන්ට අදාල පළාත් මට්ටමේ දත්ත ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව හා විභාග දෙපාර්තමේන්තුව යන ආයතන වෙතින් ලබාගෙන මීට ඉහතදී මුදල් කොමිෂන් සභාව විසින් සකස් කරන ලද සංයුක්ත දර්ශකය කාලීන දත්ත යොදාගෙන පසුගිය වසරේදී යාවත්කාලීන කරන ලදී. ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් වසර 04 කට වරක් පවත්වනු ලබන ආදායම් හා වියදම් සමීක්ෂණය මේ වසරේදී ද පවත්වනු ලැබුව ද මෙම වාර්තාව සකස් කරන විට එහි ප්‍රතිඵල ප්‍රකාශයට පත්කර නොතිබුණි. ඒ නිසා ඉහත කී සංයුක්ත දර්ශකය වඩාත් යාවත්කාලීන කිරීම අපහසු කාර්යයක් විය. කෙසේවුවත්, මෑතකදී අත්විඳි ආර්ථිකයේ පසුබෑම හා වෙනත් ආර්ථික හා සමාජයීය වෙනස්කම් සෑම පළාතකටම බොහෝ සේ ඒකාකාරී අයුරකින් බලපා ඇති බව පෙනී යන බැවින් ඉහත සඳහන් කළ විචල්‍යයන්ට අදාලව එක් එක් පළාතේ සාපේක්ෂ තත්ත්වය ඊට කලින් වසරේ පැවති තත්ත්වයට වඩා සැලකිය යුතු වෙනස්කමක් සිදු නොවූ බව හැඟේ. රජයේ සමස්ත ප්‍රාග්ධන වියදමෙන් පළාත් සභාවලට ලැබෙනුයේ 13% - 15% අතර කොටසක් පමණක් බැවින් අලුත්ම තොරතුරු ලබාගෙන යාවත්කාලීන කෙරෙන සංයුක්ත දර්ශකය මගින් පෙන්නුම් කෙරෙන ඉතාම සුළු වෙනස නිසා පළාත් අතර සම්පත් වෙන් කර දීමේ දී ඇති කෙරෙන වෙනස නොසැලකිය යුතු තරම් වනු ඇත. එබැවින් සාපේක්ෂව විශාල ප්‍රාග්ධන ප්‍රතිපාදන ප්‍රමාණයක් යොදා ගනිමින් රේඛීය අමාත්‍යාංශ විසින් පළාත් මට්ටමෙන් සිදු කෙරෙන සංවර්ධන කටයුතු සඳහා එකී ප්‍රතිපාදන යෙදවීමේ දී මුදල් කොමිෂන් සභාව විසින් යොදා ගනු ලබන පළාත් අතර අසමානතා පෙන්නුම් කෙරෙන සංයුක්ත දර්ශකය වැනි දර්ශකයක් යොදා ගැනීමේ අවශ්‍යතාවය පිළිබඳව පසුගිය වර්ෂවල අපේ නිර්දේශවල අවධාරණය කළේ ද එබැවිනි. මෙකී තත්ත්වයන් සැලකිල්ලට ගෙන ඉදිරි වර්ෂය සඳහා වූ පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රාග්ධන ප්‍රතිපාදන පළාත් අතර වෙන් කර දීමේ දී මෙම වර්ෂය සඳහා නිර්දේශ කරන ලද සංයුක්ත දර්ශකයම යොදා ගැනීම මැනවැයි නිර්දේශ කෙරේ.

වගුව **10-: පළාත්වල තෝරාගත් භෞතික, ප්‍රජාවිද්‍යාත්මක සහ සමාජ-ආර්ථික දර්ශක**

| පළාත | භූමි ප්‍රදේශය **2020** (වර්ග කි.මී.) | මධ්‍ය වාර්ෂික ජනගහනය **2020 (000)** | පළාත් ද.දේ.නි. **2020** (රු. බිලියන) | මධ්‍යන මාසික ඒක පුද්ගල ආදායම **2019** (එක් ආදායම් ලබන්නෙකුට රු.) | දුප්පතුන් සංඛ්‍යාව **- 2019** | විද්‍යා විෂය ධාරාවේ විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලැබූ සිසුන්ගේ ප්‍රතිශතය **- 2020** | වෛද්‍ය නිලධාරියෙකුට සිටින පුද්ගලයින් ගණන **2019** |
|---|---|---|---|---|---|---|---|
| බස්නාහිර | 3,684 | 6,165 | 5694 | 35,171 | 342,200 | 29.1 | 768 |
| මධ්‍යම | 5,674 | 2,781 | 1692 | 25,067 | 503,500 | 10.8 | 1080 |
| දකුණු | 5,544 | 2,669 | 1518 | 26,267 | 327,100 | 17.3 | 1291 |
| උතුරු | 8,884 | 1,152 | 689 | 24,629 | 267,200 | 5.8 | 1016 |
| වයඹ | 7,888 | 2,563 | 1653 | 28,800 | 294,400 | 11.0 | 1488 |
| උතුරු මැද | 10,472 | 1,386 | 876 | 26,323 | 144,900 | 4.5 | 1338 |
| ඌව | 8,500 | 1,387 | 812 | 22,343 | 378,500 | 5.5 | 1517 |
| සබරගමුව | 4,968 | 2,070 | 1188 | 23,517 | 468,100 | 9.5 | 1463 |
| නැගෙනහිර | 9,996 | 1,746 | 849 | 25,000 | 316,300 | 6.5 | 1095 |
| **ශ්‍රී ලංකාව** | **65,610** | **21,919** | **14973** | **28,465** | **3,042,300** | **100.0** | **1070** |

**මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, විභාග දෙපාර්තමේන්තුව**

11 වගුවේ දක්වා ඇති ප්‍රතිශත භාවිතා කරමින් මුදල් කොමිෂන් සභාව ප්‍රාග්ධන අරමුදල් පළාත් අතර බෙදා හැරීම සඳහා නිර්දේශ සකස් කර ඇත.

**වගුව 11**-: ප්‍රාග්ධන අරමුදල් වෙන් කිරීම සඳහා එක් එක් පළාතේ සංයුක්ත දර්ශක අගයන් සහ ප්‍රතිශත

| පළාත | **සංයුක්ත දර්ශකය (CI) අගය** | **CI අගයේ ප්‍රතිශත අගය** |
|---|---|---|
| බස්නාහිර | 0.67633 | 7.42 |
| මධ්‍යම | 1.01174 | 11.11 |
| දකුණු | 0.92192 | 10.12 |
| උතුරු | 1.17369 | 12.88 |
| වයඹ | 0.91576 | 10.05 |
| උතුරු මැද | 1.04349 | 11.45 |
| ඌව | 1.12125 | 12.31 |
| සබරගමුව | 1.09137 | 11.98 |
| නැගෙනහිර | 1.15499 | 12.68 |
| | | **100.00** |

ඒ අනුව, 2024 වර්ෂය සඳහා ප්‍රාග්ධන ප්‍රදානයන් ලෙස, මුදල් කොමිෂන් සභාව විසින් පළාත් සභා වෙත පහත සඳහන් ප්‍රමාණයන් නිර්දේශ කෙරේ.

**වගුව-12:** 2024 වර්ෂය සඳහා පළාත් සභා සඳහා නිර්දේශිත ප්‍රාග්ධන ප්‍රදාන ප්‍රමාණය

| පළාත් සභාව | ප්‍රාග්ධන ප්‍රදාන (රු. මි.) | | | | % |
|---|---|---|---|---|---|
| | ප.නි.සං.ප්‍ර. | උ.පා.ප්‍ර. | ආ.කා.ප්‍ර | එකතුව | |
| බස්නාහිර | 8,606 | 1,113 | 849 | 10,568 | 7.26 |
| මධ්‍යම | 14,007 | 1,666 | 282 | 15,955 | 10.95 |
| දකුණු | 12,625 | 1,518 | 468 | 14,611 | 10.03 |
| උතුරු | 16,877 | 1,932 | 396 | 19,205 | 13.18 |
| වයඹ | 12,377 | 1,507 | 333 | 14,217 | 9.76 |
| උතුරු මැද | 14,782 | 1,718 | 132 | 16,632 | 11.42 |
| ඌව | 16,182 | 1,847 | 141 | 18,170 | 12.47 |
| සබරගමුව | 15,521 | 1,797 | 177 | 17,495 | 12.01 |
| නැගෙනහිර | 16,698 | 1,902 | 222 | 18,822 | 12.92 |
| **එකතුව** | **127,675** | **15,000** | **3,000** | **145,675** | **100.00** |

**ප.නි.සං.ප්‍ර.= පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන**
**ආ.කා.ප්‍ර= ආදායම් කාර්යසාධන ප්‍රදාන**
**උ.පා.ප්‍ර.= උපමාන පාදක ප්‍රදාන**

පළාත් සභා නවය අතර ඒකාකාරී සැලසුම් රාමුවක් පවත්වාගෙන යාමට හැකි වන පරිදි, පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ පළාත් වාර්ෂික සංවර්ධන සැලසුම් සකස් කිරීම සඳහා මාර්ගෝපදේශ මාලාවක් මුදල් කොමිෂන් සභාව විසින් නිකුත් කරනු ලැබේ. ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ සහ ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් පවත්වන ලද සාකච්ඡාවලින් අනතුරුව පළාත් සභා විසින් සකස් කරනු ලබන වාර්ෂික සංවර්ධන සැලසුම් සඳහා මෙම කොමිෂන් සභාව සිය එකඟතාව ලබා දෙනු ලැබේ.

## 4.2 පළාත් සභා සඳහා සාමූහික ප්‍රදානය නිර්දේශ කිරීම

පළාත් සභා සඳහා පුනරාවර්තන ස්වභාවයේ අවශ්‍යතා ප්‍රදානය සම්පූර්ණයෙන්ම රඳා පවතිනුයේ, පුනරාවර්තන වියදම් අවශ්‍යතා සඳහා තක්සේරු කරන ලද අවසාන ප්‍රමාණය, අදාල පළාත් සභාවේ ඇස්තමේන්තුගත ආදායම සහ භාණ්ඩාගාරයෙන් මාරු කරන ලද ආදායම මත ය. මුදල් කොමිෂන් සභාව විසින් අදාල පළාත් බලධාරීන්ගේ, ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ සහ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් පවත්වනු ලබන සමාලෝචන සාකච්ඡා මගින් පළාත් සභාවල වියදම් අවශ්‍යතා සහ පළාත් ආදායම පිළිබඳ ඉලක්ක තක්සේරු කරන ලදී.

මුදල් කොමිෂන් සභාව විසින් තක්සේරු කරන ලද, පළාත් සභාවන්හි පුනරාවර්තන වියදම් අවශ්‍යතාවය සහ පළාත්වලින් අපේක්ෂිත ආදායමෙන් 50% ක කොටස (අපේක්ෂිත ආදායමෙන් 50% ක් ප්‍රාග්ධන ප්‍රතිපාදනවලට හිලව් කිරීමට නිර්දේශ කරන බැවින් ) අතර පරතරය පිරවීම සඳහා, මුදල් කොමිෂන් සභාව විසින් පළාත් සභා වෙත සාමූහික ප්‍රදානය ලබාදීම නිර්දේශ කරනු ලැබේ. පළාත් සභාවන්හි ඇස්තමේන්තුගත මුළු ආදායමේ කුඩා කොටසක් වන පළාත් සභා වෙත මාරු කිරීමට අපේක්ෂිත ඇස්තමේන්තුගත රජයේ ආදායම පිළිබඳ තොරතුරු රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව විසින් තවමත් ලබා දී නොමැති බැවින්, පළාත් ආදායම් ඇස්තමේන්තුවලට එම තොරතුරු ඇතුළත් කර නොමැත.

ඒ අනුව, මුදල් කොමිෂන් සභාව විසින් 2024 වර්ෂය සඳහා නිර්දේශිත සාමූහික ප්‍රදාන පහත දැක්වේ.

වගුව 13: 2024 වර්ෂය සඳහා සාමූහික ප්‍රදාන

(රු. 000)

| පළාත | තක්සේරු කළ මුළු පුනරාවර්තන වියදම | පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන වලට ගැලපීමෙන් පසු පළාත් ආදායම් ඉලක්ක ** | මුදල් කොමිෂන් සභාව විසින් නිර්දේශ කරන ලද මුළු සාමූහික ප්‍රදාන (ආදායම් ගැලපීම ඇතුළත්ව ) |
|---|---|---|---|
| **(1)** | **(2)** | **(3)** | **(4)= (2) - (3)** |
| බස්නාහිර | 88,823,253 | 7,450,000 | 81,373,253 |
| මධ්‍යම | 64,253,927 | 870,000 | 63,383,927 |
| දකුණු | 59,673,561 | 1,106,200 | 58,567,361 |
| උතුරු | 44,218,598 | 240,000 | 43,978,598 |
| වයඹ | 58,075,384 | 1,570,000 | 56,505,384 |
| උතුරු මැද | 37,045,354 | 255,000 | 36,790,354 |
| ඌව | 39,592,546 | 90,000 | 39,502,546 |
| සබරගමුව | 50,046,550 | 320,000 | 49,726,550 |
| නැගෙනහිර | 49,134,757 | 25,000 | 49,109,757 |
| **එකතුව** | **490,863,929** | **11,926,200** | **478,937,729** |

| | | |
|---|---|---|
| එකතු කළා - | හදිසි අරමුදල සඳහා ඉල්ලීම - 2024 | 3,404,191 |
| | අත්තිකාරම් B ගිණුම සඳහා ඉල්ලීම - 2024 | 18,336,734 |
| | මධ්‍යම පළාත් සභාවේ 2022 වසරේ දරන ලද වියදම් | 2,000,000 |
| | **තක්සේරු කළ මුළු සාමූහික ප්‍රදාන** | **502,678,654** |

**** පළාත් ආදායම (මුද්දර ගාස්තු හා උසාවි දඩ මුදල් හැර) මෙම වාර්තාවේ 3.3 ඡේදයෙන් යෝජිත පරිදි ප්‍රාග්ධන ප්‍රදානයන්ට ගැලපීමෙන් පසු පුනරාවර්තන වියදම්වලට හිලව් කිරීමට ඉතිරි වන ආදායම**

සාමූහික ප්‍රදානයේ ප්‍රමාණය තීරණය කිරීමේදී, භාණ්ඩාගාරය විසින් මුළු ඇස්තමේන්තුගත පුනරාවර්තන වියදම්වලින් මුළු ආදායම අඩු කිරීමේ ක්‍රමවේදය භාවිතා කර ඇත.

2022.10.31 දින අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද මුදල් කොමිෂන් සභා නිර්දේශය 2024 වසර සඳහා භාණ්ඩාගාරය විසින් අනුගමනය කරන බව උපකල්පනය කරමින්, 2024 වසර සඳහා තක්සේරු කරන ලද සම්පූර්ණ පුනරාවර්තන අවශ්‍යතාවය වන රු. මි. 514,604.854 න් පළාත් ආදායමේ 50% කොටස ගැලපීම තුලින් සාමූහික ප්‍රදානය තක්සේරු කළ යුතු වේ. එමෙන්ම, ප්‍රාග්ධන වියදම් පියවා ගැනීම සඳහා පළාත් සභාවලට තම අපේක්ෂිත ආදායම් එකතුවෙන් 50%ක් භාවිත කිරීමට ඉඩ සැලසීමට ද යෝජනා කෙරේ.

ඒ අනුව, මුදල් කොමිෂන් සභාව විසින් 2024 වර්ෂය වෙනුවෙන් පළාත් සභා සඳහා නිර්දේශ කරන ලද මුළු ප්‍රදාන (ප්‍රාග්ධනය සහ පුනරාවර්තන) ප්‍රමාණය රු. මිලියන 648,353.654 කි.

නිරීක්ෂණ සහ නිර්දේශ:

1. මුදල් කොමිෂන් සභාව විසින් අනුමත සේවක සංඛ්‍යාව සඳහාත්, සත්‍ය සේවක සංඛ්‍යාව සහ පුරප්පාඩු සේවක සංඛ්‍යාව සඳහා විශේෂයෙන් සංවර්ධන නිලධාරී තනතුරු සහ ප්‍රාථමික මට්ටමේ තනතුරු සඳහාත් ප්‍රතිපාදන නිර්දේශ කර ඇති බැවින් මෙතෙක් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලැබී නොතිබුන ද පසුව සඳහන් කළ කණ්ඩායම් දෙක සඳහා ද ප්‍රමාණවත් ප්‍රතිපාදන ඇතුළත් කිරීම විශේෂයෙන් නිර්දේශ කරමු.

2. පිළිගත හැකි සහ වෘත්තීමය සම්මතයන් මත පදනම් වූ අයවැය ක්‍රමවේදයක් හරහා සේවක සංඛ්‍යාව තක්සේරු කර, ආයතනික පදනමින් ඔවුන් නැවත සේවයේ යෙදවීමේ දැඩි අවශ්‍යතාවයක් ඇති බව අපි නිරීක්ෂණය කරමු.

3. පළාත් කටයුතු සුමටව පවත්වාගෙන යාම සඳහා අත්‍යවශ්‍ය වන පහත සඳහන් පළාත් සභා ව්‍යවස්ථාපිත ආයතන සඳහා අරමුදල් වෙන් කිරීම, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් ලබා දී ඇති අනුමැතිය මත සිදු කර ඇත.

    - පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය
    - මගී ප්‍රවාහන අධිකාරිය
    - මුල් ළමාවිය සංවර්ධන අධිකාරිය

    කෙසේ වෙතත්, ඔවුන්ගේම ආදායමෙන් වැටුප් ගෙවනු ලැබුවද, වෙනත් එබඳු කිසිදු අධිකාරියක් විසින් අනුමත සේවක සංඛ්‍යාවට වඩා අතිරික්ත සේවක සංඛ්‍යාවක් පවත්වා ගෙන යනු ඇතැයි අපේක්ෂා නොකෙරේ.

4. පළාත් සභාවලට අනුයුක්ත කෙරෙන රජයෙන් බඳවාගත් සේවක සංඛ්‍යාවේ පුද්ගලික පඩිනඩි සඳහා අවශ්‍යතාවය අප වෙත ඉදිරිපත් කරන ලෙස, මුදල් කොමිෂන් සභාව විසින් ප්‍රධාන රේඛීය අමාත්‍යාංශවලින් (සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය, අධ්‍යාපන, කෘෂිකර්ම) ඉල්ලා සිටින ලදි. අධ්‍යාපන අමාත්‍යාංශය, සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය මෙම ඉල්ලීමට ප්‍රතිචාර දක්වා ඇති අතර, 2024 සඳහා ඔවුන්ගේ මූල්‍ය ඉල්ලීම් අපගේ පුනරාවර්තන අවශ්‍යතා තක්සේරු කිරීමේදී සැලකිල්ලට ගෙන ඇත.

    අනෙකුත් අමාත්‍යාංශවලින් මූල්‍ය අවශ්‍යතා සඳහා ප්‍රතිචාරයක් නොමැති බැවින්, 2024 සඳහා පුනරාවර්තන අවශ්‍යතා තක්සේරුවට ඔවුන්ගේ අවශ්‍යතා ඇතුළත් කිරීමට හැකියාවක් නොමැත.

5. හදිසි අවශ්‍යතා සහ වියදම්වල ස්වභාවය සැලකිල්ලට ගනිමින්, වත්කම් නඩත්තු කිරීම සඳහා රු. බි. 29.8 ක් වූ පළාත් ඉල්ලීම්, පළාත් සභා සමඟ සාකච්ඡා කර රු.බි. 22 ක් ලෙස තක්සේරු කර ඇත.

6. 2024 වර්ෂය සඳහා මධ්‍යම පළාත සඳහා තක්සේරු කළ රු. 63,383,927,000 ක මුදලට අමතරව, 2022 වසර සඳහා දරන වියදම් පියවා ගැනීමට මුදල රු. බි. 2 ක් (දැනටමත් භාණ්ඩාගාරය විසින් එකඟ වී ඇති පරිදි) තක්සේරු කළ සාමූහික ප්‍රදානයට එකතු කළ යුතු වේ. ඒ අනුව මධ්‍යම පළාත සඳහා වෙන් කළ යුතු මුළු මුදල රු. 65,383,927,000 ක් වේ.

# 5 වන පරිච්ඡේදය

## ප්‍රතිපත්තිමය නිර්දේශ

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ජ ව්‍යවස්ථාවේ (4) සහ (5) වන අනුව්‍යවස්ථා අනුව 2024 වර්ෂය සඳහා පළාත් සභාවල අරමුදල් අවශ්‍යතාවය හා එකී අරමුදල් පළාත් සභා අතර වෙන් කරදීමේ ප්‍රතිපත්ති සම්බන්ධයෙන් ගරු ජනාධිපතිතුමා වෙත ඉදිරිපත් කෙරෙන නිර්දේශවලට අතිරේකව පළාත් සභා සඳහා වඩාත් අර්ථාන්විත පරිදි සම්පත් වෙන් කරදීම හා එකී සම්පත් වඩාත් කාර්යක්ෂම ලෙස යොදාගැනීම පිළිබඳවත් පහත දැක්වෙන නිර්දේශ ඉදිරිපත් කෙරේ.

**01.පළාත් සභා වෙත ප්‍රමාණවත් පරිදි අරමුදල් නොලැබීමේ ගැටළුව විසඳීම සඳහා වන නව ප්‍රවේශයක්:**

මීට අදාලව මීට ඉහතදී පහත සඳහන් නිර්දේශ ද මුදල් කොමිෂන් සභාව විසින් ඉදිරිපත් කර ඇත.

(අ) පළාත් සභා සඳහා ප්‍රමාණවත් අරමුදල් ලබාදීම (2022 වර්ෂය සඳහා වූ ප්‍රතිපත්තිමය නිර්දේශ අංක 01)
(ආ) පවත්නා සම්පත් සීමාව තුළම තුලිත ප්‍රාදේශීය සංවර්ධනය සඳහා වඩාත් අර්ථාන්විත ලෙස සම්පත් වෙන් කිරීම (2023 වර්ෂය සඳහා වූ ප්‍රතිපත්තිමය නිර්දේශ අංක 02)

අතීතයේදී පළාත් සභා සඳහා ප්‍රමාණවත් අරමුදල් නොලැබුණ බව පෙන්වා දෙමින් මුදල් කොමිෂන් සභාව විසින් මීට ඉහත දී අවස්ථා කිහිපයකදී අවධාරණය කරන ලද්දේ පළාත් සභා වෙත පවරා දෙනු ලැබූ විෂයයන්ටම අදාලව රේඛීය අමාත්‍යාංශ වෙත ලබා දෙන ප්‍රාග්ධන ප්‍රතිපාදන ප්‍රමාණය එකී විෂයයන්ට අදාලව පළාත් සභාවන්ට ලබාදෙන ප්‍රාග්ධන ප්‍රදානයන්ට වඩා බෙහෙවින් වැඩි බවයි. පෙර නොවූ විරූ අන්දමේ රාජ්‍ය මූල්‍ය දුෂ්කරතාවන්ට රජයට මුහුණ දීමට සිදුව ඇතිබව පිළිගන්නා අතරම ඉහත කී ගැටළුව විසඳීම සඳහා ප්‍රායෝගික යෝජනාවක් පසුගිය වසරේ දී අප විසින් ඉදිරිපත් කරන ලදී. රජයට අතිරේක වැය බරක් නොවන පරිදි පළාත් සභාවන්ට පවරා දී ඇති විෂයයයන්ට අදාලව රේඛීය අමාත්‍යාංශ වෙත ලබාදෙන සම්පත් පළාත් සභා වෙත යොමු කිරීමට එමගින් යෝජනා කෙරිණ. ඉහත කී නිර්දේශය ක්‍රියාත්මක කිරීමට අදාලව යම් ප්‍රගතියක් ලබාගෙන ඇති බව මහා භාණ්ඩාගාරය විසින් 2024 අයවැය ඇස්තමේන්තු කැඳවීම සම්බන්ධයෙන් නිකුත් කරන ලද චක්‍රලේඛයේ පහතින් දක්වා ඇති 4.1(iv) කොටසේ පළමුවන ඡේදය මගින් නිරීක්ෂණය වේ.

" පළාත් සභා වෙත සෘජුව පැවරී ඇති කාර්යයන් සඳහා රේඛීය අමාත්‍යාංශ හෝ දෙපාර්තමේන්තු යටතේ ප්‍රතිපාදන ඇතුළත් නොකළ යුතු වේ. රේඛීය අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ප්‍රාදේශීය මට්ටමින් සිදුකරනු ලබන වැඩසටහන්/ව්‍යාපෘති පළාත් සභා වැඩසටහන්/ව්‍යාපෘති සමඟ ද්විකරණය වීම වැලැක්වීම සඳහා ඒවා සම්බන්ධයෙන් පළාත් සභා සමඟ සම්බන්ධීකරණය වී සැලසුම් සකස් කරගත යුතු වේ".

රේඛීය අමාත්‍යාංශ විසින් ඉහත කී උපදෙස් දැඩි ලෙස අනුගමනය කරන්නේ නම් හා මහා භාණ්ඩාගාරය විසින් එබඳු විෂයයන්ට අදාලව රේඛීය අමාත්‍යාංශ වෙත ප්‍රතිපාදන ලබාදීම සීමා කරන්නේ නම් පළාත් සභා සඳහා අවශ්‍ය ප්‍රතිපාදන තම සමස්ත ප්‍රාග්ධන ප්‍රතිපාදන තුළම ලබාදීමට මහා භාණ්ඩාගාරයට හැකිවනු ඇත.

මුදල් කොමිෂන් සභාවේ යථෝක්ත නිර්දේශය සම්බන්ධයෙන් භාණ්ඩාගාරය විසින් ගනු ලැබූ තවත් සාධනීය පියවරක් වනුයේ එතෙක් අධ්‍යාපන අමාත්‍යාංශය වෙත වෙන් කර දෙනු ලැබූ පාසල් පෝෂණ වැඩසටහන සඳහා වූ ප්‍රතිපාදන 2023 වසරේ සිට පළාත් සභා වෙත ලබාදීමට ගනු ලැබූ තීරණයයි. දැනට වාර්තා වන අන්දමට පළාත් අධ්‍යාපන බලධාරීන් විසින් පළාත් ප්‍රධාන ලේකම්වරයාගේ අධීක්ෂණය යටතේ අනෙකුත් පළාත් බලධාරීන්ගේ සහභාගීත්වයෙන් මෙම වැඩපිළිවෙල මැනවින් ක්‍රියාත්මක වන බව පෙනේ. පළාත් සභාවට මෙම ප්‍රතිපාදන සෘජුව ලබා දීම නිසා මෙම විෂයයට අදාලව ප්‍රතිපාදන නියමිත වේලාවට නොලැබුණ අවස්ථාවන්හි දී (අක් මුදල් ලැබෙනුයේ පළාත් සභා විෂයභාර අමාත්‍යාංශය හරහා බැවින්) ප්‍රධාන ලේකම්වරුන්ට පළාත් සභාවේ ආදායම් යොදා මෙම වැඩපිළිවෙල බාධාවකින් තොරව ක්‍රියාත්මක කිරීමට ද හැකිවී ඇත (ඇතැම් එබඳු අවස්ථාවලදී මේ සඳහා යොදාගෙන ඇත්තේ පළාත් පාලන ආයතන වෙත පවරා දිය යුතු පළාත් සභා ආදායම බව දැනගන්නට ඇත).

එබැවින් ඉහත (ආ) යටතේ විස්තර කෙරුණු නිර්දේශය ක්‍රියාත්මක කරන ලෙස මෙම කොමිෂන් සභාව විසින් ඉතා ඕනෑකමින් නිර්දේශ කෙරේ.

**02.වඩාත් කාර්යක්ෂම ලෙස සම්පත් වෙන් කිරීම:**
මෙම නිර්දේශයට අදාලව මීට ඉහතදී පහත සඳහන් නිර්දේශ ඉදිරිපත් කර ඇත.

(අ) ජාතික හා පළාත් මට්ටමින් පොදු හා ඒකාබද්ධ සැලසුම් යාන්ත්‍රණයකට අනුගත වීම (2022 වර්ෂය සඳහා වූ ප්‍රතිපත්තිමය නිර්දේශ අංක 06)

(ආ) ජාතික හා පළාත් මට්ටමින් වඩාත් අර්ථාන්විත ලෙස ප්‍රතිපාදන වෙන්කිරීම නියාමනය කිරීම සඳහා පූර්ණ බලතල සහිත ආයතනයක් ස්ථාපිත කිරීම (2023 වර්ෂය සඳහා වූ ප්‍රතිපත්තිමය නිර්දේශ අංක 02)

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ජ ව්‍යවස්ථාවේ (4) සහ (5) අනුව්‍යවස්ථාවන් මගින් අපේක්ෂිත තුලිත ප්‍රාදේශීය සංවර්ධනයක් උදාකරලීම කරුණු කීපයක්ම නිසා පළාත් සභාවන්ට පමණක් කළ නොහැකි බව නිතර නිතර මෙම කොමිෂන් සභාව විසින් අවධාරණය කර ඇත. ඉන් පළමුවැන්න නම් පළාත් සභාවන්වලට ලබාදෙන ප්‍රාග්ධන අරමුදල් ප්‍රමාණවත් නොවීමයි. දෙවන කරුණ නම් රේඛීය අමාත්‍යාංශ විසින් දිවයිනේ විවිධ ප්‍රදේශවල යම් යම් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම තුලින් සම්පත් යෙදවීමේදී පළාත් අතර හෝ පළාත් තුළ පවත්නා විෂමතාවන් ගැන සැලකිලිමත් නොවී එම ප්‍රතිපාදන ලබාදීමයි (මෙහිදී එම ආයතන විසින් මුදල් කොමිෂන් සභාව විසින් යොදාගනු ලබන අන්දමේ සංයුක්ත දර්ශකයක් අනුගමනය නොකෙරේ). තුන්වන කරුණ වන්නේ රේඛීය අමාත්‍යාංශ හෝ පළාත් සභා විසින් එක් එක් ක්ෂේත්‍රයන්ට අදාලව ක්‍රියාත්මක කෙරෙන සංවර්ධන වැඩපිළිවෙලවල් සඳහා කිසියම් ජාතික ආංශික ප්‍රතිපත්තියක් නොතිබීමයි. එබැවින් සමස්ථ සම්පත් ප්‍රමාණය ඒ ඒ අංශවලට වෙන්කර දීමත්, ක්‍රියාත්මක කළ යුතු ව්‍යාපෘති ප්‍රමුඛතාගත කිරීමත් සඳහා ඉන්දියාවේ තිබූ ක්‍රමසම්පාදන කොමිෂන් සභාව වැනි ප්‍රබල ආයතනයක් පිහිටුවීම මැනවැයි වූ යෝජනාව 2023 වර්ෂය සඳහා අප විසින් ඉදිරිපත් කරන ලද ප්‍රතිපත්ති නිර්දේශවල ඇතුළත් විය. මෙම යෝජනාවම පාර්ලිමේන්තුවේ ජාතික සභාවේ අනුකමිටුවක් (එනම් කෙටිකාලීන, මැදිකාලීන හා ජාතික ප්‍රතිපත්ති සම්පාදනය කිරීමේ ප්‍රමුඛතා හඳුනාගැනීම පිළිබඳව වූ අනුකමිටුව) විසින් ද ඉදිරිපත් කර තිබිණ. මෙම යෝජනාව සම්බන්ධයෙන් රාජ්‍ය අංශයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් හා විශ්වවිද්‍යාල ආචාර්යවරුන් ඇතුළු අදාල පාර්ශව රාශියක සහභාගීත්වයෙන් පවත්වන ලද සාකච්ඡා මාලාවකින් අනතුරුව මේ පිළිබඳ වූ සංකල්ප පත්‍රිකාවක් හා විෂය නිර්ණය සකස් කරන ලදී. එමෙන්ම 1957 අංක 58 දරන ජාතික සැලසුම් කොමිෂන් සභා පනත හා සමාන පනතක් සම්මත කරගත යුතු බව ද එහිදී නිර්දේශ කෙරිණ. වේගවත් සහ තුලිත ප්‍රාදේශීය සංවර්ධන අපේක්ෂාවන් ඉටු කරගැනීමේ අදහසින් හා විධිමත් ආංශික ප්‍රතිපත්තීන් සම්පාදනය කිරීම පහසුකරලීම උදෙසා මෙම යෝජනාව පිළිබඳ ඉදිරි කටයුතු කරන මෙන් ද මුදල් කොමිෂන් සභාව නිර්දේශ කරයි.

**03. සංවර්ධන කටයුතු සඳහා මෙන්ම සේවා සැපයීම සඳහා පළාත් සභා ව්‍යුහය නිසි පරිදි ප්‍රයෝජනයට ගැනීම:**

මෙම කරුණට අදාලව මේ වන විටත් පහත සඳහන් නිර්දේශ මුදල් කොමිෂන් සභාව විසින් ඉදිරිපත් කර ඇත.

(අ) ජාතික සංවර්ධන වැඩසටහන්/ව්‍යාපෘතීන් පළාත් හා දිස්ත්‍රික්ක තුළ ක්‍රියාත්මක කිරීමේදී පළාත් සභාවන්හි දායකත්වය වැඩි වශයෙන් ලබාගැනීම (2022 වර්ෂය සඳහා වූ ප්‍රතිපත්තිමය නිර්දේශ අංක 04)

(ආ) සංවර්ධන පාර්ශ්වකාර ආයතන විසින් ලබාදෙන අරමුදල් යටතේ ක්‍රියාත්මක කෙරෙන ව්‍යාපෘතීන් සඳහා ව්‍යාපෘති කාර්යාල ස්ථාපිත කිරීමෙන් වැළකීම (2023 වර්ෂ සඳහා වූ ප්‍රතිපත්තිමය නිර්දේශ අංක 04 )

එමෙන්ම අමාත්‍ය මණ්ඩලය විසින් අවස්ථා දෙකකදී අනුමත කරන ලද ඉහත සඳහන් නිර්දේශවලට අනුගත වීමට රේඛීය අමාත්‍යාංශ විසින් යම් මැළිකමක් දක්වන බවක් පෙනෙන නමුත් මහා භාණ්ඩාගාරය විසින් 2024 වසර සඳහා අයවැය යෝජනා කැඳවීම සඳහා නිකුත් කළ චක්‍රලේඛයේ 4.1 කොටසේ (IV) වන ඡේදයේ දෙවන උපඡේදයේ මෙකී අවශ්‍යතාවය ගැන පහත සඳහන් පරිදි යළි අවධාරණය කර තිබීම ගැන විශේෂයෙන් සඳහන් කිරීම වටී.

"එසේම පළාත් සභා යටතේ සැලකිය යුතු කාර්යමණ්ඩලයකින් යුත් ආයතන පද්ධතියක් පවතින බැවින්, රේඛීය අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු/ආයතනවල සේවා බෙදා හැරීම සඳහා හැකි සෑමවිටම පළාත් සභාවල එකඟතාවය මත එම ආයතන ව්‍යුහය යොදා ගත යුතු වේ".

විවිධ විදේශාධාර වැඩසටහන් යටතේ වන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා ව්‍යාපෘති කාර්යාල පිහිටුවීම සීමා කිරීම සඳහා රජය විසින් එළඹුනු තීරණය සාධනීය තීරණයක් බව මෙම කොමිෂන් සභාව විශ්වාස කරයි. විදේශාධාර ව්‍යාපෘති සම්බන්ධයෙන් සාකච්ඡා මට්ටමේදීම මේ තත්ත්වය පිළිබඳව අදාල රාජ්‍ය ආයතන විසින් ආධාර සපයන ආයතනවලට ඒත්තු ගැන්විය හැකිවන පරිදි රජය විසින් මේ සම්බන්ධ ස්ථිර තීරණයක් ගැනීම යෝග්‍ය යැයි මුදල්

කොමිෂන් සභාව නිර්දේශ කරයි. පුහුණු හා පළපුරුදු කාර්ය මණ්ඩලයන් සිටියද ප්‍රමාණවත් තරම් ප්‍රාග්ධන ප්‍රතිපාදන නොලැබීම නිසා අපේක්ෂිත පරිදි සංවර්ධන කටයුතු සීමා කිරීමට පළාත් සභාවන්ට සිදුවී ඇති පසුබිමක විදේශාධාර ව්‍යාපෘති මගින් ප්‍රමාණවත් තරම් ප්‍රතිපාදන ලැබෙන නමුත් එම ප්‍රතිපාදන නිසි පරිදි උපයෝජනය කිරීමට අවශ්‍ය මානව සම්පත් තම ආයතනයට පළාත් මට්ටමේ නොසිටීමේ ගැටලුවට රේඛීය අමාත්‍යාංශයන්ට මුහුණ දීමට සිදුවී ඇති බව නොරහසකි. ඉහත සඳහන් නිර්දේශය ක්‍රියාත්මක කිරීම තුලින් මේ ගැටලුවට යම් විසඳුමක් ලැබෙනු ඇත.

**04.අයවැය කාර්යයන්ට අදාලව පළාත් සභා ඍජුව පාර්ලිමේන්තුවට වගවන ආයතන බවට පත් කිරීම:**

මීට අදාලව පසුගිය වසර තුනෙහිම පහත සඳහන් නිර්දේශ ඉදිරිපත් කර ඇත.

(අ) අයවැය කාර්යය සඳහා පළාත් සභා විශේෂ වියදම් ඒකක ලෙස සැලකීම (2021 වර්ෂය සඳහා වූ ප්‍රතිපත්තිමය නිර්දේශ අංක 01)

(ආ) අයවැය කාර්යයන් සඳහා පළාත් සභා විශේෂ වියදම් ඒකක වශයෙන් වර්ගීකරණය කිරීම (2022 වර්ෂය සඳහා වූ ප්‍රතිපත්තිමය නිර්දේශ අංක 11)

(ඇ) ප්‍රධාන ලේකම්වරුන් පාර්ලිමේන්තුව වෙත ඍජුවම වගවන ක්‍රමවේදයක් සැකසීම (2023 වර්ෂය සඳහා වූ ප්‍රතිපත්ති නිර්දේශය)

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ප්‍රතිපාදන අනුවත් 1987 අංක 42 දරන පළාත් සභා පනතේ විධිවිධාන අනුවත් පළාත් සභාවන්හි මූල්‍ය පාලනයට අදාලව (අනෙකුත් කිසිදු රාජ්‍ය ආයතනයක් සම්බන්ධයෙන් සලසා නොමැති) ප්‍රතිපාදන සැලකිල්ලට ගනිමින් අයවැය කාර්යය සඳහා පළාත් සභාවන් විශේෂ වියදම් ඒකක ලෙස සලකන ලෙසත් ප්‍රධාන ලේකම්වරුන්, ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් ලෙස පත් කරන ලෙසත් වූ නිර්දේශ මෑත අතීතයේ අවස්ථා කිහිපයකදීම මුදල් කොමිෂන් සභාව විසින් ඉදිරිපත් කරන ලදී. එකී නිර්දේශ ඉදිරිපත් කරන ලද්දේ පහත සඳහන් කරුණු සැලකිල්ලට ගනිමින්ය.

- ❖ පළාත් සභාවන් හැර ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් ස්ථාපිත කරන ලද සියලුම ආයතන අයවැය කාර්යය සඳහා විශේෂ වියදම් ඒකක ලෙස නම්කර තිබීම.
- ❖ ඉහතින් නිර්දේශිත පරිදි කටයුතු කිරීම තුළින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148 වන ව්‍යවස්ථාවෙන් අපේක්ෂිත පරිදි පළාත් සභාවන්හි මූල්‍ය කටයුතු පාර්ලිමේන්තුවේ ඍජු අධීක්ෂණයට ලක් කළ හැකි වීම.
- ❖ ගතවූ අවුරුදු 35 තුළ පළාත් සභාවන් ක්‍රමිකව මූල්‍ය පාලනය පිළිබඳව පරිනතභාවයකට පත්ව තිබීම (පාර්ලිමේන්තුවේ රාජ්‍ය ගිණුම්කාරක සභාව විසින් රාජ්‍ය ආයතනයන්හි මූල්‍ය පරිපාලන කාර්යසාධනයට අදාලව 2020 දී පිරිනමන ලද ස්වර්ණ සම්මාන 15 න් 12 ක්ම පළාත් සභා ආයතන විසින් හිමිකර ගැනීම මීට හොඳම සාක්ෂියකි).
- ❖ අනෙක් රාජ්‍ය ආයතනයන් සඳහා මෙන් නොව පළාත් සභා සඳහා අවශ්‍ය වන අරමුදල් නිර්දේශ කිරීම සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන්ම ස්වාධීන ආයතනයක් (එනම් මුදල් කොමිෂන් සභාව) ස්ථාපිත කිරීම තුළින් සලසා ඇති විශේෂ විධිවිධාන.
- ❖ ප්‍රධාන ලේකම්වරයා විසින් කළමනාකරණය කළ යුතු අයවැය ප්‍රතිපාදන ප්‍රමාණය බෙහෙවින් විශාල වීම හා ප්‍රධාන ලේකම්වරයා ද රේඛීය අමාත්‍යාංශ ලේකම්වරුන් මෙන්ම ගරු ජනාධිපතිවරයා විසින්ම පත් කරනු ලැබීම
- ❖ යෝජිත පරිදි කටයුතු කිරීම තුළින් පළාත් සභා වෙත අක් මුදල් මුදාහැරීම වඩාත් ක්‍රමවත් කළ හැකි වීම (දිස්ත්‍රික් ලේකම් කාර්යාලවලට මෙන් පළාත් සභාවන්හි පුනරාවර්තන ප්‍රතිපාදන කෙලින්ම එම ආයතන වෙත නොලැබේ).

යෝජිත රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත මගින් රජයේ සියලුම මට්ටම් සඳහා පුළුල් මූල්‍ය පාලන රාමුවක් හඳුන්වාදීමට උත්සාහ දරන පසුබිම ගැන ද සැලකිලිමත් වෙමින් ඉහත සඳහන් නිර්දේශය ධනාත්මක ලෙස සලකන ලෙස අපි නිර්දේශ කරමු.

**05.පළාත් සභාවන්හි ආදායම පළාත් සභාවන්හි සංවර්ධන කටයුතු සඳහා වෙන් කිරීමේ අවශ්‍යතාවය:**

මේ සම්බන්ධයෙන් අතීතයේදී කරන ලද නිර්දේශ;

- ❖ බලතල බෙදා හැරීම හා සබැඳි සංවර්ධන අරමුණු සමග පළාත් සභාවන්හි ආදායම් උත්පාදනය සම්බන්ධ කිරීම (2023 වර්ෂය සඳහා වූ ප්‍රතිපත්තිමය නිර්දේශ අංක 07 )

පළාත් සභාවන් විසින් උපයනු ලබන ආදායම පළාත් සභාවන්ට රජය විසින් දෙනු ලබන පුනරාවර්තන ප්‍රතිපාදනයන්ගෙන් අඩු කිරීමේ වර්තමාන ප්‍රතිපත්තිය පහත සඳහන් හේතූන් නිසා පළාත් සභා පිහිටුවීමෙන් පළාත් සභාවන්ට ආදායම් ඉපයීමේ බලතල (පොදුවේ රාජ්‍ය ආදායමට බැරවන ආදායම් ප්‍රභවයන්ට අතිරේකව) පැවරීමත් සඳහා වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ අරමුණු සමග සමපාත නොවන බව මුදල් කොමිෂන් සභාව දැඩි සේ විශ්වාස කරයි.

i. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ජ ව්‍යවස්ථාවේ (5) වන අනු ව්‍යවස්ථාවෙන් හා එහිම (අ) සහ (ඇ) අනු ව්‍යවස්ථාවලිනුත් හැඟී යන පරිදි පළාත් සභාවන් පිහිටුවීමේ අරමුණ වන්නේ රටේ තුලිත ප්‍රාදේශීය සංවර්ධනය ඇති කිරීමයි.

ii. පළාත් සභාවන්හි ආදායම තිබිය යුත්තේ රජයේ සමස්ත ආදායමෙන් රජය විසින් රටපුරා පොදුවේ සලසන රාජ්‍ය සේවාවන්ගෙන් ඇතැම් සේවාවන්හි පිරිවැය සඳහා යොදා ගැනීමට නොව ප්‍රදේශයේ සංවර්ධන වියදම් පියවීම සඳහා වීම.

iii. පළාත් ආදායම පළාත් සභා වෙත ලබාදෙන පුනරාවර්තන ප්‍රදානයෙන් අඩුකිරීම තුලින් සමාජයේ එක් කොටසක් "අතිරේක" බද්දකට යටත් කිරීමක් සිදුවන බැවින් එතුලින් එක් කොටසකට අසමානව සැලකීම. මේ තත්ත්වය වඩාත් පැහැදිලි වනුයේ පළාත් අධ්‍යාපනය හා පළාත් සෞඛ්‍යය සම්බන්ධයෙන් සලකා බලන විටය. පොදුවේ ගත් කල්හි නිදහස් අධ්‍යාපන රාජ්‍ය ප්‍රතිපත්තිය යටතේ සියළුම ජාතික පාසල්වල වියදම් රජයේ ආදායමෙන් පියවන අතර එකී රාජ්‍ය ආදායමට පළාත් සභා පාසල්වල අධ්‍යාපනය ලබන සිසුන්ගේ දෙමව්පියෝද වක්‍ර බදු ගෙවීම මගින් දායක වෙති. තත්ත්වය එසේ තිබියදීත් පළාතේ සංවර්ධන කටයුතු සඳහා වෙන් කළ යුතුව ඇති පළාත් ආදායම (පුනරාවර්තන ප්‍රදනයන්ගෙන් අඩුකිරීම මගින්) පළාත් සභා පාසල්වල වියදම්වලින් කොටසක් පියවා ගැනීම සඳහා යෙදවෙන තත්ත්වය තුලින් මෙම විෂමතාවය හොඳින් පැහැදිලි වේ. එබැවින් ජාතික පාසල් හා සමග සසඳන විට වඩාත් අවාසිදායක් තත්ත්වය ක් ඇති පළාත් සභා පාසල්වල ප්‍රාග්ධන ස්වරූපයේ වියදම් දැරීම සඳහා පළාත් සභා ආදායම යොදා ගැනීම වඩාත් තර්කානුකූල වේ.

පළාත් සභා ආදායම පළාත් සභාවන් සඳහා වූ පුනරාවර්තන ප්‍රදානයන්ගෙන් අඩු කිරීමේ වර්තමාන ප්‍රතිපත්තිය වෙනස් කරන ලෙසත් ඒ වෙනුවට එකී ආදායම පළාත් සභාවන්හි තුලිත සංවර්ධනයක් ඇති කිරීමට හැකි වන පරිදි ප්‍රාග්ධන ප්‍රතිපාදනවලට හිලව් කිරීම සඳහා පසුගිය වසරේ ඉදිරිපත් කරන ලද නිර්දේශය ක්‍රියාත්මක කරන ලෙසත් මෙම කොමිෂන් සභාව විසින් නිර්දේශ කෙරේ. එකී නිර්දේශය ගරු ජනාධිපතිතුමා විසින් පිළිගනු ලදුව අමාත්‍ය මණ්ඩලය විසින් 2022.10.31 දින අනුමත කර ඇත.

අපගේ එකී නිර්දේශය යෝජිත පරිදිම ක්‍රියාත්මක කිරීම තුළින් පුනරාවර්තන වියදම් කෙරෙහි ඇති වන බලපෑම අඩු කිරීම සඳහා 2024 වර්ෂයේ දී පළාත් ආදායමෙන් 50% ක් පමණක් ප්‍රාග්ධන ප්‍රදානයන්ට ගැලපීමත්, ඉතිරි 50% පුනරාවර්තන ප්‍රදනයන්ට ගැලපීමත් සුදුසු බව මුදල් කොමිෂන් සභාව විසින් යෝජනා කෙරේ. මෙම යෝජනාව ක්‍රියාත්මක කිරීම තුළින් කිසියම් පළාත් සභාවකට විශේෂ වාසියක් නොලැබෙන බව තහවුරු කිරීම සඳහා කුමන අයුරකින් හෝ (භාණ්ඩාගාරයෙන් සලසා දෙනු ලබන ප්‍රාග්ධන ප්‍රතිපාදන හා පළාත් ප්‍රාග්ධන වියදම පළාත් ආදායම සමග ගැලපීමේ වාසිය යන දෙයාකාරයෙන්ම) පළාත් සභාව වෙත ලැබෙන මුදල් ප්‍රමාණය මුදල් කොමිෂන් සභාව විසින් සකස් කරන ලද ඇමුණුම 01 හි දැක්වෙන සංයුක්ත දර්ශකය අනුව වෙන් කර දීමට මුදල් කොමිෂන් සභාවට හැකි වනු ඇත. ඒ අනුව, එක් එක් පළාත් සභාවට වෙන් වනුයේ ප්‍රාග්ධන ප්‍රතිපාදනයෙන් පළාත් ආදායම අඩු කොට සංයුක්ත දර්ශකය අනුව හිමිවන අරමුදල් ප්‍රමාණය පමණි. එමෙන්ම, කුමන ආකාරයකින් හෝ පළාත් සභාවන් වෙත ලැබෙන ප්‍රාග්ධන ප්‍රතිපාදනවලින් කෙරෙන ප්‍රාග්ධන ස්වරූපයේ වැඩ මුදල් කොමිෂන් සභාවේ මාර්ගෝපදේශ අනුව පළාත් සභා විසින් සකස් කරනු ලබන වාර්ෂික සංවර්ධන සැලැස්ම තුළට ඇතුළත් කෙරෙනු ඇත. යෝජිත ක්‍රමය තුළින් පළාත් සභාවේ හදිසි අවශ්‍යතා සඳහා යම් මුදල් ප්‍රමාණයක් තිබීමේ අවශ්‍යතාවය දැඩිව දැනෙනුයේ 2023 වසරේ සිට පළාත් සභා හරහා ක්‍රියාත්මක වන පාසල් පෝෂණ වැඩසටහන යටතේ ඉටු කිරීමට අවශ්‍ය වන ඉතා කුඩා

පරිමාණයේ ප්‍රාග්ධන ස්වරූපයේ කටයුත්තක් සඳහා හෝ ඉක්මණින් අරමුදල් ලබාගැනීමේ අපහසුතාවය දැඩිව දැනුන බැවිනි.

එබැවින් 2023 වර්ෂය සඳහා ඉදිරිපත් කරනු ලදුව දැනටමත් ගරු ජනාධිපතිවරයාගේ හා 2022.10.31 වන දින අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලැබී ඇති මෙම යෝජනාව ඉහත ඡේදයේ යෝජිත සංශෝධනවලට යටත්ව ක්‍රියාත්මක කරන ලෙස නිර්දේශ කෙරේ. මෙම යෝජනාව ක්‍රියාත්මක කිරීම මඟින් රජයට අතිරේක වැය බරක් දැරීමට සිදු නොවන බව ද විශේෂයෙන් සඳහන් කල යුතුව ඇත.

**06.සිසුන් පනහට අඩු පාසල් ප්‍රති සංවිධානය තුලින් ග්‍රාමීය ප්‍රදේශවල හා වතු වැවිලි අංශයේ අධ්‍යාපනය වැඩිදියුණු කිරීමේ අවශ්‍යතාවය:**

මුදල් කොමිෂන් සභාව රැස් කරන ලද තොරතුරුවලට අනුව මේ වන විට දිවයින පුරා සිසුන් 50 ට අඩු පාසල් 1402ක් පවතින අතර එයින් ඇතැම් පාසල්වල සිටින්නේ සිසුන් දහයකටත් අඩු සංඛ්‍යාවකි. ඉතා දුෂ්කර ප්‍රදේශවල වාසය කරන සිසුන්ට නගරබද පාසල්වලට පැමිණීමට ඇති අපහසුතාවය මෙවැනි පාසල් පැවතීමට සාධාරණ හේතුවක් විය හැකිය.

කෙසේ වෙතත් මෙම කරුණ හා සම්බන්ධ පහතින් දක්වා ඇති ගැටළු කෙරෙහි අවධානය යොමු කළ යුතුව ඇත.

- ප්‍රවාහන දුෂ්කරතා නොමැති, වන අලි උවදුරු හෝ ගමන් කිරීමට අපහසු භූ විෂමතාවයන් නොමැති කොළඹ දිස්ත්‍රික්කය තුළද මෙවැනි කුඩා පාසල් දක්නට ඇත.
- මෙම කුඩා පාසල්වල ඉගෙනුම ලබන සිසුන් ඇතුළත් කළ හැකි වඩා වැඩි පහසුකම් හා ගුරුවරුන් සහිත පාසල් එම කුඩා පාසල් ආසන්නයේම පිහිටා තිබීම.
- පාසල්වල සිටින සිසුන් සංඛ්‍යාව කුඩා වුවද, එම පාසල්වල 1 සිට 5 වසර දක්වා හෝ 1 සිට 10 වසර දක්වා හෝ පන්ති පවත්වාගෙන යනු ලැබේ. ඇතැම් අවස්ථාවල උසස්පෙළ දක්වා පන්ති පවතින අතර ඒ අනුව එම පාසල් සඳහා ප්‍රමාණවත් ගුරුවරුන් සංඛ්‍යාවක්ද සේවයේ යෙදවිය යුතුව ඇත. මේ හේතුවෙන් ඇතැම් පාසල්වල සිසුන් සංඛ්‍යාවට වඩා වැඩි ගුරුවරුන් සංඛ්‍යාවක් සිටින අවස්ථා ද නිරීක්ෂණය වන අතර මේ තත්ත්වය මෙම පාසල්වල එක් සිසුවෙකු වෙනුවෙන් දරනු ලබන වියදම අනවශ්‍ය ලෙස ඉහල යාමට හේතු වී ඇත.
- මෙසේ සාපේක්ෂව වැඩි වියදමක් දැරුවද මෙම පාසල්වල ඉගැන්වීමේ කටයුතුවල හා බාහිර ක්‍රියාකාරකම්වල ගුණාත්මකභාවය තදාසන්නයේ ඇති වඩා විශාල පාසල්වලට සාපේක්ෂව පහල මට්ටමක පවතී.
- අනෙකුත් ග්‍රාමීය පාසල්වල ගුරු පුරප්පපාඩු උග්‍ර ලෙස පවතින පසුබිමක එම ප්‍රදේශවලම කුඩා පාසල්වල මෙවැනි තත්ත්වයක් පැවතීම අයෝග්‍ය තත්‍වයකි.
- එම නිසා මෙම කුඩා පාසල් ආසන්නයේ පවතින වඩා විශාල පාසල් සමග ඒකාබද්ධ කළහොත් එම පාසල්වල සේවය කරන ගුරුවරුන් විශාල සංඛ්‍යාවක්, පුරප්පපාඩු පවතින ග්‍රාමීය ප්‍රදේශවල පිහිටි වෙනත් පාසල්වලට මුදා හැරිය හැකිය.
- පාසල ආසන්නයේ පදිංචි එකී පාසල්වල විදුහල්පතිවරුන්ගෙන් හා ගුරුවරුන්ගෙන් මෙන්ම ප්‍රාදේශීය දේශපාලන ක්‍රියාකාරීන්ගෙන්ද එවැනි පාසල් ප්‍රතිසංවිධානය කිරීමේදී විරෝධතාවයන් මතුවන බවද නිරීක්ෂණය වේ.

ග්‍රාමීය පාසල්වල සේවය කරනු ලබන ගුරුවරුන්ගේ සේවය ප්‍රශස්ත මට්ටමින් ලබා ගැනීමටත් එම පාසල්වල දැනට ඉගෙනුම ලබන සිසුන්ට අධ්‍යාපනය ලබාදීම සඳහා වඩාත් ගුණාත්මක පරිසරයක් ඇති කිරීමත් සඳහා මෙවැනි කුඩා පාසල් ප්‍රති සංවිධානය කිරීමේ අවශ්‍යතාවය ඉහත කරුණු තුළින් මනාව සාධාරණීකරණය වේ. එබැවින් මෙකී කුඩා පාසල් වඩාත් අර්ථාන්විත පරිදි ප්‍රතිසංවිධානය කිරීම සඳහා රජය විසින් ප්‍රතිපත්තිමය තීරණයකට එළඹීම සුදුසු යැයි මෙම කොමිෂන් සභාව විසින් යෝජනා කරනු ලැබේ.

**07. පළාත් සභාවන්හි හා පළාත් පාලන ආයතනයන්හි ආදායම් ප්‍රභවයන්ගෙන් අපේක්ෂිත ආදායම ලබා නොගැනීම:**

මේ සම්බන්ධයෙන් මීට පෙර ඉදිරිපත් කර ඇති නිර්දේශ;

(අ) පළාත් ආදායම් ඉහළ නැංවීම සම්බන්ධයෙන් වන බාධාවන් ඉවත් කිරීම (2023 වර්ෂය සඳහා ඉදිරිපත් කරන ලද ප්‍රතිපත්තිමය නිර්දේශ අංක 12)

පළාත් සභා ලැයිස්තුවෙහි අයිතම අංක 36.1 සිට 36.20 දක්වා වූ පළාත් සභා වෙත පවර දී ඇති ආදායම් ප්‍රභවයන් තුළින් පළාත් සභාවල ප්‍රාග්ධන අවශ්‍යතාවයෙන් සැලකිය යුතු කොටසක් සපුරා ගත හැකිවනු ඇතැයි 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සම්මත කරන අවස්ථාවේ අපේක්ෂා කෙරුණි. එහෙත් මෙම වාර්තාවේ 3 වන පරිච්ඡේදය මගින් පෙන්වා දී ඇති ආකාරයට බස්නාහිර පළාත හැර අනෙක් පළාත් සභා 8 මගින් උත්පාදනය කරන

ආදායම ප්‍රමාණවත් වන්නේ එම පළාත් සභාවල ප්‍රාග්ධන අවශ්‍යතාවයෙන් කුඩා කොටසක් පියවා ගැනීමට පමණි. ආර්ථික කටයුතු බොහොමයක් කේන්ද්‍ර ගතව ඇති බස්නාහිර පළාතේ පමණක් මෙම තත්වය තරමක් වෙනස් වේ.මුදල් කොමිෂන් සභාව පළාත් බලධාරීන් සමග පවත්වන ලද සාකච්ඡා හා මේ සම්බන්ධයෙන් සිදු කරන ලද අධ්‍යයන මගින් ඉස්මතු කරන ලද කරුණු අනුව පෙනී යන්නේ පළාත් තුළ ආදායම් උත්පාදනයට ඇති විභවයන් ප්‍රශස්ත ලෙස භාවිතයට ගෙන නොමැති බවයි.

රජය විසින් සම්පූර්ණ වැටුප් පිරිවැය දරනු ලබන පළාත් පාලන ආයතන සම්බන්ධයෙන් ද, එකී ආයතනවල ආදායම් උත්පාදන විභවතාවය හා සැබැවින්ම එකතු කරනු ලබන ආදායම අතර සැලකිය යුතු පරතරයක් ඇති බව මුදල් කොමිෂන් සභාව මගින් එක රැස් කරන ලද තොරතුරු අනුව පෙනේ. පළාත් පාලන ආයතනයන් විසින් ආදායම් ඉපැයීම සම්බන්ධයෙන් පෙන්නුම් කෙරෙන දුර්වල කාර්යසාධනයට හේතු වූ කරුණු අතර දේපළ යාවත්කාලීන ලෙස තක්සේරු නොකිරීම, ආදායම් එකතු කිරීම පිළිබඳ ප්‍රමාණවත් පරිදි පසුවිපරම් නොකිරීම (මෙය මුදල් කොමිෂන් සභාව විසින් 2022 අග භාගයේ සිට ආරම්භ කර ඇත) හා බදු එකතු කිරීමේ ගතානුගතික ක්‍රම තුළින් බදු ගෙවන්නන් අපහසුතාවයට පත්වීම ප්‍රධාන වේ.

එමනිසා, පළාත් ආදායම් උත්පාදනය මෙන්ම පළාත් පාලන ආයතනවල ආදායම් උත්පාදනය ද ඉහළ නැංවීමට ඇති බාධක ඉවත් කිරීම සඳහා පහත සඳහන් යෝජනා ක්‍රියාත්මක කිරීම මැනවැයි යෝජනා කරමු.

(අ) පළාත් සභා ලැයිස්තුව මගින් පළාත් සභා වෙත පවරා ඇති විෂයන්ට අදාල වන, එහෙත් රේඛීය අමාත්‍යාංශ විෂය පථයට ගැනෙන විවිධ පනත් මගින් පනවා ඇති ගාස්තු, බදු, හා අයකිරීම්වලට අදාල අනුපාත යාවත්කාලීන කරන ලෙස එකී රේඛීය අමාත්‍යාංශවලට උපදෙස් ලබා දීම

(ආ) පළාත් සභා වෙත පැවරී ඇති ආදායම් විෂයන්වලට අදාලව පාර්ලිමේන්තුව විසින් පනවා ඇති සීමාවන් ඉවත් කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම (ඉදිරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන මගින්)

(ඇ) ආදායම් එකතු කිරීම ඉහළ නැංවීම සඳහා පළාත් සභාවන් හා පළාත් පාලන ආයතන දිරිගැන්වීම් සඳහා,

- මෙම වාර්තාවේ 3 වන පරිච්ඡේදයේ සඳහන් යෝජිත ආදායම් කාර්යසාධන ප්‍රදානය හඳුන්වා දීම, හා
- මෙම වාර්තාවේ 3 වන පරිච්ඡේදය හා ඉහතින් දක්වා ඇති ප්‍රතිපත්තිමය නිර්දේශ අංක 05 මගින් යෝජනා කර ඇති පරිදි පළාත් සභා ආදායම (අවම 50% ක් වත්) පළාත් සංවර්ධන කටයුතු සඳහා යොදා ගත හැකි වන පරිදි පළාතේ ප්‍රාග්ධන වියදම හා ගැලපීම

(ඇ) පළාත් පාලන ආයතන සඳහා විකල්ප තක්සේරුකරණ ක්‍රමවේදයක් හඳුන්වා දීමට අවශ්‍ය කටයුතු කරන ලෙස පළාත් පාලන විෂය භාර ගරු අමාත්‍යවරයාගෙන් ඉල්ලා සිටීම

(ඉ) පළාත් සභා/ පළාත් පාලන ආයතනවල ආදායම් එකතුකිරීමේ ක්‍රමවේදය වැඩිදියුණු කිරීම සඳහා තොරතුරු තාක්ෂණය යොදා ගැනීම සඳහා විදේශ සංවර්ධන පාර්ශ්වකරුවන්ගේ සහාය ලබා ගැනීමට ඇති හැකියාව සොයා බලන ලෙසට විදේශ සම්පත් දෙපාර්තමේන්තුවෙන් ඉල්ලා සිටීම

**ඇමුණුම 01**

**යෝජිත ආදායම් ගැලපීමෙන් පසුව නිර්දේශිත පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදානය සංයුක්ත දර්ශකයට අනුව පළාත් අතර බෙදී යන ආකාරය පැහැදිලි කිරීම**

**(රු.මි.)**

| පළාත | සංඛ්‍යානමය සූත්‍රයට අනුව සංයුක්ත දර්ශකය අගය | නිර්දේශිත මුළු පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදානය | ඇස්තමේන්තුගත ආදායම් ඉලක්කය | ඇස්තමේන්තුගත ආදායම මගින් සපුරාලිය හැකි පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදානය (%) | පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදානය හා ගලපන ලද ආදායම | ආදායම් ගැලපීම පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදානයේ (%) ලෙස | ආදායම ගැලපීමෙන් පසු නිර්දේශිත පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදානය * |
|---|---|---|---|---|---|---|---|
| **1** | **2** | **3** | **4** | **5 = (4/3)*100** | **6** | **7= (6/4)*100** | **8 = 3-6** |
| බස්නාහිර | 0.67633 (7.42%) | 10,356.00 | 9,200.00 | 88.84 % | 1,750.00 | 19.02 % | 8,606.00 |
| මධ්‍යම | 1.01174 (11.11%) | 15,507.00 | 2,370.00 | 15.28 % | 1,500.00 | 63.29 % | 14,007.00 |
| දකුණු | 0.92192 (10.12%) | 14,125.00 | 2,606.20 | 18.45 % | 1,500.00 | 57.56 % | 12,625.00 |
| උතුරු | 1.17369 (12.88%) | 17,977.00 | 1,340.00 | 7.45 % | 1,100.00 | 82.09 % | 16,877.00 |
| වයඹ | 0.91576 (10.05%) | 14,027.00 | 3,220.00 | 22.96 % | 1,650.00 | 51.24 % | 12,377.00 |
| උතුරු මැද | 1.04349 (11.45%) | 15,982.00 | 1,455.00 | 9.10 % | 1,200.00 | 82.47 % | 14,782.00 |
| ඌව | 1.12125 (12.31%) | 17,182.00 | 1,090.00 | 6.34 % | 1,000.00 | 91.74 % | 16,182.00 |
| සබරගමුව | 1.09137 (11.98%) | 16,721.00 | 1,520.00 | 9.09 % | 1,200.00 | 78.95 % | 15,521.00 |
| නැගෙනහිර | 1.15499 (12.68%) | 17,698.00 | 1,025.00 | 5.79 % | 1,000.00 | 97.56 % | 16,698.00 |
| එකතුව | **100%** | **139,575.00** | **23,826.20** | **17.07 %** | **11,900.00** | **49.95 %** | **127,675.00** |

*මුදල් කොමිෂන් සභාව විසින් 2024 වර්ෂය සඳහා නිර්දේශ කරන ලද පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදානය, පළාත් ආදායමින් 50% කට හිලව් කල පසු මෙම වගුවේ දෙවන තීරුවේ දැක්වෙන සංයුක්ත දර්ශකය අනුව පළාත් සභාවලට බෙදී යන්නේ කෙසේදැයි මෙම තීරුවෙන් පෙන්නුම් කෙරේ. එක් එක් පළාත් සභාවට සත්‍ය වශයෙන් ලැබෙන පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන ප්‍රමාණය ජාතික අයවැය මඟින් වෙන් කරනු ලබන ප්‍රතිපාදන ප්‍රමාණය මත තීරණය වේ (කරුණාකර මෙම වාර්තාවේ 3 වන පරිච්ඡේදයේ 3.3 ඡේදය හා අපගේ ප්‍රතිපත්තිමය නිර්දේශ අංක 5 බලනු මැනවි).